THE CHATHAM STREET JOURNAL
Trust your source. Trust your decisions. https://csj.lk/ 2023|08|06 Vol: 48



## රනිල් කියන්නේ පුද්ගලයෙක් නෙමෙයි, ක්‍රමවේදයක්
P 08-09

## රාජතාන්ත්‍රික මැන්ඩේට් එකේ අප්ඩේට් එක කොහොමද?
P 06-07



## ජල ගාස්තු වැඩිවීම රටට ප්‍රතිලාභයක්
P 07

# තවත් අභියෝගයක්



### ගොවිතැනට වතුර නෑ
### ආහාර හිඟයක්
### විදුලි කප්පාදුවක්
P 02

## හිල් මුට්ටිවලට වතුර පුරවන විපක්ෂ දේශපාලනය
P 03






P 04

## විසඳිය යුත්තේ දෙමළ ජනතාවගේ ප්‍රශ්නද? පක්ෂවල ප්‍රශ්නද?

## රුසියා-යුක්රේන යුද උණුසුමට දිය වෙන ලෝක ආර්ථිකය
P 10





# තවත් අභියෝගයක්!

පසුගිය වසර කිහිපය තුළදී මුහුණ දුන් ආර්ථික අර්බුදය යම් සමථයකට පත්කර ගනිමින් රට ස්ථාවරවීම ආරම්භ වනවාත් සමඟ එළැඹෙන මාස දෙක තුන තුළදී තවත් විශාල අර්බුදයකට මුහුණ පෑමට ශ්‍රී ලංකාවට සිදුව තිබේ. මේ වන විට සිදුවෙමින් පවතින කාලගුණික විපර්යාසය මත ඇතිව තිබෙන දැඩි නියගය හේතුවෙන් මෙරට ජලාශ සහ වැව් අමුණු ශීඝ්‍රයෙන් සිඳීයාමට ලක්වීම සිදුවෙමින් තිබේ. ඒ අනුව වගා කටයුතු සඳහා ජලය නිකුත් කිරීම සීමා කර තිබෙන අතර ජල විදුලිබල උත්පාදනය සීමා කිරීමට සිදුවෙන ලකුණු පහළව ඇත. මේ තත්වය මත යළි ආහාර හිඟයක් මෙන්ම විදුලි කප්පාදුවක අනතුර රට ඉදිරියේ තිබේ.

මේ වන විට වර්ධනය වෙමින් තිබෙන කාලගුණික විපර්යාසය එල්-නිනෝ තත්වයක් ලෙස හඳුන්වන අතර එය සාමාන්‍යයෙන් වසර කිහිපයකට වරක් සිදුවන ස්වභාවික තත්වයකි. පැසිෆික් සාගරයේ උෂ්ණත්වය ඉහළයාම නිසා වායුගෝලීය පීඩනය සහ සුළං රටා වෙනස්වීම මෙමගින් සිදුවේ. ඒ අනුව එම බලපෑමට හසුවන ශ්‍රී ලංකාව තුළ නියඟ, ගංවතුර සහ පාරිසරික උෂ්ණත්වයේ වෙනස්වීම් අත්විඳිමට සිදුවේ.

කෙසේ නමුත් අනෙක් බොහෝ රටවල් මෙන් ශ්‍රී ලංකාවට එල්-නිනෝ බලපෑම ඒකාකාරී නොවන අතර රටේ විවිධ ප්‍රදේශවලට විවිධ බලපෑම් එල්ල වේ. විශේෂයෙන්ම රටේ උතුරු සහ නැඟෙනහිර ප්‍රදේශ එල්-නිනෝ බලපෑමට වැඩි අවදානමක් ඇති අතර, මෙම ප්‍රදේශවල වර්ෂාපතනය අඩුවීමට ලක් වේ. ලෝක කාලගුණ විද්‍යා සංවිධානයට අනුව, නියඟය, ගංවතුර සහ අනෙකුත් ආන්තික කාලගුණික සිදුවීම්වලට තුඩු දෙන එල්-නිනෝ 2023 තුන්වන කාර්තුවේදී නැවත පැමිණෙනු ඇතැයි පෙර අනාවැකි කියා තිබිණි. ශ්‍රී ලංකාවේ එල්-නිනෝගේ බලපෑම දැනටමත් දැනෙමින් පවතින අතර රටේ සමහර ප්‍රදේශවල නියඟ සහ ජල හිඟය අත්විඳිමින් සිටී.

මීට පෙර 2015/16 වසරවලදී ද මෙවැනි එල්-නිනෝ තත්වයක් හට ගත් අතර ඒ අනුව එක් ප්‍රදේශයකට මහා නියඟයක් එන විට අනෙක් ප්‍රදේශයකට අධික වර්ෂා සමඟ ගංවතුරද ඇති වී ආපදා ගණනාවකට මුහුණ දීමට සිදු විය.

කෙසේ නමුත් මේ වන විට උඩවලවේ ජලාශය යටතේ වගා කර ඇති කුඹුරු අක්කර 65,000ක් අධික නියගය හේතුවෙන් විනාශවීමේ අවදානමක් මතුව තිබේ. උතුරු මැද පළාතේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ නඩත්තු කෙරෙන වැව් 3000කට අධික ප්‍රමාණයක් නියඟය හේතුවෙන් සිඳී යමින් පවතින බව වාර්තා වේ. මේ හේතුවෙන් විශාල පිරිසක් පානීය ජලය ලබා ගැනීමේ අපහසුතාවයකට මුහුණදී සිටිති. එසේම එම ප්‍රදේශවල වන සතුන්ද ජල හිඟය හේතුවෙන් දැඩි දුෂ්කරතාවයට පත්ව සිටින බව වාර්තා වෙයි. එල්-නිනෝ තත්වය හේතුවෙන් සාගර ප්‍රවාහවල වෙනස්කම් සහ මත්ස්‍ය විශේෂ සංක්‍රමණයවීම නිසා ධීවර කර්මාන්තයට ද බලපෑම් එල්ලවීමේ අවධානමක්ද පවතී.

මේ වසරේ සහල් නිෂ්පාදනයටද මෙමගින් දැඩි බලපෑමක් එල්ල විය හැකි බව රජය පෙන්වා දෙන අතර, මේ වන විටත් භෝග වගාවන්ට රුපියල් කෝටි 3000ක පමණ පාඩුවක් සිදුව ඇතැයිද පෙන්වා දෙයි. කොහොම නමුත් ඉදිරියේ දී ඇති විය හැකි ආහාර හිඟයට මුහුණ දීම සඳහා මේ වනවිට රට තුළ පවතින සහල් තොග ආරක්ෂා කර ගැනීමේ වැඩපිළිවෙලක් වහා ක්‍රියාත්මක කිරීමට රජය පියවර ගෙන ඇත. මේ අනුව සත්ව ආහාර හා බියර් නිෂ්පාදනය කිරීම සඳහා සහල් යොදා ගැනීම වහා අත්හිටුවීමට පියවර ගෙන තිබේ.

මේ අතර චීනය, පාකිස්තානය, ඉන්දියාව හා බංග්ලාදේශය ආදී රටවලට දරුණු ගංවතුර තත්වයන් ඇති වු බැවින් එහි වගාබිම් විශාල ප්‍රමාණයක අපේක්ෂිත අස්වැන්න අහිමි වන තත්වයන් තුළ ඔවුන්ගේ සහල්, බී ලූණු, අල, කඩල, පරිප්පු, මිරිස්, කුළුබඩු ආදි අපනයනය සීමාවීම සහ මිල ඉහළ යෑම සිදුවිය හැකිය. මේ ඉදිරියේදී එම ආනයනික ආහාර ද්‍රව්‍යවල මිල ඉහළ යාමේ අවදානමක්ද පවතී. එල්-නිනෝ තත්වය හමුවේ විය හැකිව තිබෙන අවදානම් තත්වය සුළුපටු නැති බව මේ අනුව පැහැදිලිය.

මේ වන විට විදුලි නිශ්පාදනය කරන ජලාශවල ජලය අඩුවීම නිසා පෞද්ගලික ඩීසල් බලාගාර හා අනෙක් සියලු බලාගාරවලින් විදුලිය ලබාග නිමින් පැය විසිහතර පුරා අඛණ්ඩව විදුලිය ලබාදීමට පියවර ගන්නා බව රජය පවසා ඇත. එහෙත් ඉන්ධන මගින් රටේ විදුලි අවශ්‍යතාව සපුරා ගැනීම නිසා මෙම වසරේ ලංකා විදුලිබල මණ්ඩලයට වන අමතර පාඩුව රුපියල් කෝටි පන්සියයේ සීමාව ඉක්මවා යනු ඇති බවද විදුලි ඉංජිනේරුවෝ පෙන්වා දෙති. එමෙන්ම මේ වෙනුවෙන් අමතර විදේශ විනිමය යොදා ගැනීමට සිදුවේ. ආර්ථික අර්බුදයෙන් පසුව විදේශ සංචිත ප්‍රමාණවත් ලෙස තවමත් ගොඩනැඟී නැති තත්වයක් තුළ එය වෙනම අර්බුදයක් ලෙස මතුවෙනු ඇත. එම නිසා ජල විදුලිබලය ඇතුළු පුනර්ජනනීය විදුලි උත්පාදනය අඛණ්ඩව පවත්වාගෙන යෑම රටට හිතකරය. විදුලිබල මණ්ඩලයේ විදුලි උත්පාදන වියදම් වැඩි වුවහොත් විදුලි බිල් වැඩිවීමේ අවදානමද තිබේ. කෙසේ නමුත් මේ වන විට දකුණු පළාතේ විදුලි අවශ්‍යතාවය සපුරණ සමනල වැව සිඳි යමින් තිබෙන තත්වයන් හමුවේ තවදුරටත් ගොවිතැන සඳහා ජලය නිකුත් කිරීම වන්නේ නම් එම පළාත්වල යම් විදුලි කප්පාදුවක් සිදු කිරීම විය හැකි බවත් පැවැසේ.

මේ අනුව ඉදිරියේදී ජල හිඟය පිළිබඳ සංකීර්ණ ගැටළුවට මුහුණ දීමට රජයට සිදුවන අතර ගොවිතැන ද, ජල විදුලිබලය ද වඩා වැදගත් යන්න තෝරා ගැනීමට සිදුවනු ඇත. මන්ද මේ දෙකම තුලනය කර ගනිමින් පවත්වාගෙන යෑමේ හැකියාව ක්‍රමයෙන් සීමා වෙමින් තිබෙන නිසාය. මෙහිදී වඩාත්ම ප්‍රායෝගික විසඳුම වෙනු ඇත්තේ වගා කටයුතු වෙනුවෙන් ජලය මුදා හැරීම දැඩිව සීමා කිරීමය. එමගින් සිදුවිය හැකි හානිය වන්නේ, රටේ අස්වනු අඩු වීමත් ආහාර හිඟයක් ඇති වීම සහ ගොවි ජනතාවගේ ආදායම් මාර්ග අහිමි වීම යන ගැටළුය. නමුත් එම ගැටළු විසඳීම සඳහා ආහාර ආනයනය කිරීම සහ ගොවීන්ට වන්දි ලබා දීමක් මගින් යම් සමතයකට පැමිණීමේ හැකියාව රජයට ඇත. ඒ සඳහා රාජ්‍ය ආදායම් ප්‍රමාණවත් වනු ඇත. පොහොර සහනාධාරයන් සහ වගා යටිතල පහසුකම් ආදිය වෙනුවෙන් රජය වාර්ෂිකව වෙන් කරන බිලියන සිය ගණනක මුදල් හෝ මේ සඳහා යොදා ගත හැකිය.

එහෙත් දිර්ඝ කාලීනව විදුලිබල කප්පාදුවකට යෑමට සිදු වුවහොත් රටේ සමස්ත ප්‍රජාවම අර්බුදයකට මුහුණ දීමට සිදුවන අතර කර්මාන්ත ව්‍යාපාර ආදියෙහි විශාල කඩා වැටීමක් සිදු විය හැකිය. පසුගිය කාලයේ සිදුවූ විදුලිබල කප්පාදු නිසා එම තත්වය අත්විඳීමට හැකි වූ අතර තවමත් ජනතාවට එයින් වූ ආර්ථිකමය හානිය යථාවත් කරගැනීමට හැකිව නැත. එසේම එමගින් ජාතික ආර්ථිකයට වන පාඩුව පියවා ගැනීම පහසු නොවනු ඇත. එය රාජ්‍ය බදු ආදායම් මගින් පියවීම හෝ ගොවිතැන ආරක්ෂා කරගැනීමෙන් කළ නොහැක. ගොවිතැන මගින් ජාතික ආර්ථිකයට දක්වන දායකත්වයට වඩා විදුලිබලය මගින් වන දායකත්වය අති මහත්ය.

මේ නිසා රජය හමුවේ වන අභියෝගය වන්නේ පසුගිය ආර්ථික අර්බුදය හමුවේ ජාතික ආදායම් අහිමි වීම නිසා මුහුණ දුන් පීඩාකාරී තත්වය යළි ඇතිවීම වලක්වා ගැනීම විය යුතු තැනට සියල්ල කළමනාකරණය කිරීමය. රටේ ආදායම් අහිමි වුවහොත් සෑම ක්ෂේත්‍රයකම මීට වසරකට පෙර පැවැති අර්බුදයම නැවත ඇතිවනු ඇත. මේ නිසා එල්-නිනෝ කාලගුණික විපර්යාසය හමුවේ රට නොවැටී තබා ගැනීමට නම් වඩා ප්‍රයෝගික විසඳුම වෙනු ඇත්තේ විදුලිබල නිපදවීම වෙනුවෙන් ප්‍රමුඛතාවය ලබා දීම විය හැකිය. රජය ඒ සම්බන්ධයෙන් නිවරදිම තීරණය ගත යුතුය.

කොරෝනා වසංගත තත්වයන් සහ ගෝලීය ආර්ථික අර්බුද හමුවේ රටේ ආර්ථිකය නිසි ලෙස කළමනාකරණයට අසමත් වීමේ ප්‍රතිවිපාක ලෙස රට දැවැන්ත කඩා වැටීමකට ලක් විය. නමුත් පවතින නියඟය හමුවෙත් යළි වැරදි ආර්ථික උපාය මාර්ග අනුගමනය කිරීමෙන් වැලැකී වඩාත් නිවැරදිම ක්‍රියාමාර්ග යුතුය. ඒ වෙනුවෙන් රටට යම් කැපකිරීමක් කරන්නට සිදු වේ නම් එය සිදු කළ යුතුය. ජනප්‍රිය විසඳුම් වෙනුවට දුෂ්කර වුවත් නිවැරදි විසඳුම් ක්‍රියාත්මක වන්නේ නම් වැටෙන්න නියමිත වළට නොවැටී එය තරණය කිරීමට පහසු වෙනු ඇත. ඒ තත්වයන් සියලු පාර්ශ්ව විසින් අවබෝධ කර ගත යුතු අතර ඒ වෙනුවෙන් රජයට අවශ්‍ය සහයෝගය ලබාදීම විය යුතුය. දේශපාලනික හෝ බඩගෝස්තර වුවමනාවන් වෙනුවෙන් මෙම තත්වයන් පාවිච්චි කිරීමට කවර හෝ කණ්ඩායමක් කටයුතු කරනවා නම් එය නොවිය යුතු අපරාධකාරී, රටට ද්‍රෝහී කටයුත්තක් බවත් කිව යුතුය. එසේ කියන්නේ ලංකාවේ අවස්ථාවාදී විපක්ෂ කණ්ඩායම් මේ ආපදා තත්වයන් මත **"කාලගුණය පාලනය කරන්න බැරි ආණ්ඩුවක් මොකටද?"** කියා හෝ මුග්ධ සටන් පාඨ සමගින් අරගල වැඩවර්ජන කරමින් තුට්ටු දෙකේ දේශපාලනයට යොමුවීමේ විශාල ඉඩකඩක් පවතින බැවිනි. මේ ස්වභාවික ආපදාව පාවිච්චි කරමින් රට අරාජික කර දැමීම වෙනුවෙන් තුච්ඡ ලෙස යොදා ගැනීමේ හැකියාව සහ වුවමණාව ඇතැම් පිරිස්වලට තිබෙන බැවිනි. ඔවුන් බලා සිටින්නේම මෙවැනි අර්බුදයක් හෝ මතුවී රජය අසීරුතාවයට පත්වන තෙක්ය. ඒ අනුව පැවැති ආර්ථික අර්බුදය හමුවේත් එයින් ගොඩ ඒමට කිසිදු සහයක් රජයට හෝ ජනතාවට නොදී ඒ වෙනුවෙන් රජය ගන්නා සෑම පියවරක්ම කඩා කප්පල් කිරීමට සහ ජනතාව නොමඟ යැවීමට වෙර දැරූ විපක්ෂය මෙම එල්-නිනෝ තත්වයන්ද රටට ජනතාවට හෙණ ගහල ගියත් තමන්ගේ බල පෙරේතකම් වෙනුවෙන් පාවිච්චි කිරීමේ ඉඩ කඩ ඉතා ඉහළය.

මේ අතර ඇතැම් ගොවි සංවිධාන ගොවිතැන වෙනුවෙන් ජලය ලබා දෙන ලෙස ඉල්ලා උද්ඝෝෂණ ක්‍රියාමාර්ගවලටද අවතීරණය වී ඇති අතර විපක්ෂ කණ්ඩායම් රටේ ඇත්ත තත්වය වසන් කරමින් මෙම අහිංසක ජනතාව නොමඟ යවමින්ද තිබේ. ඉදිරියේදී මේ කණ්ඩායම්වල පෙළඹවීමෙන් මාවිල්ආරු සොරොව්ව විවෘත කළා සේ කඩා පැනීම් කර වීරකම් පෙන්වන ජල අරගල වුවත් ඇති විය හැකිය. නමුත් ඒවායෙන් සිදු විය හැකි හානිය නියඟයෙන් විය හැකිව තිබෙන හානියට වඩා දැඩි වෙනු ඇත. පීඩා විඳින්න වන්නේ පොදු ජනතාවටමය.

මේ කියන සියළු තත්වයන් ඇති නොවිය හැකි දේ නොවේ. මීට වඩා වඩා බරපතල දේ විය හැකි මෙන්ම මේ තරම් බරපතල තත්වයක් ඇති නොවීමද විය හැකිය. මන්ද කාලගුණය ගැන අනාවැකි වරදින්නට පුළුවන් නිසාය. කොහොම නමුත් බංකොලොත් රට ගොඩගෙන, ආර්ථික අර්බුදය ජයගැනීම වෙනුවෙන් පියවර ගත් ජනාධිපතිවරයා සහ රජය, එහිදී ජනතාවට වග වූ ලෙසම මේ එල්-නිනෝ කාලගුණික තත්වයේ ආපදා මෙන්ම, වල්මත් විපක්ෂය මගින් විය හැකි හානිදායක තත්වයන් ද පාලනය කිරීමට සුදානම් විය යුතුව තිබේ. එම අභියෝගයත් ජය ගත යුතුය.

ජයතුංග බණ්ඩාර

# හිල් මුට්ටිවලට වතුර පුරවන විපක්ෂ දේශපාලනය

පසුගිය වසරේ ගාලු මුවදොර කේන්ද්‍ර කරගත් අරගලය ක්‍රියාත්මක වූයේ හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂව බලයෙන් පහකිරීම වෙනුවෙනි. 'ගෝඨා ගෝ හෝම්' සටන් පාඨයට පමණක් මෙම පිරිස ලඝු වූ අතර අනෙක් මතයකට ඉඩ නොදෙන බලහත්කරයක්ද එම අරගල භූමිය තුළ ක්‍රියාත්මක විය. කෙසේ නමුත් ගෝඨා එළවීමෙන් පසුව රටේ ප්‍රශ්නවලට විසඳුම් ලැබෙනවාද කියන ගැටළුවට මේ අයට උත්තර තිබුණේ නැත. ඒක ඊට පස්සේ බලාගමු, දැන් ගෝඨා එළවීම විය යුතු බව දිගටම ගෙන ගිය මතය වේ. එහෙත් ඊට එරෙහිව දේශපාලන සබුද්ධිකත්වය ඇති පිරිස අර්බුදයට හේතු භූත වූ කාරණා මතු කර, විය යුතුව තිබෙන්නේ දේශපාලන හා ආර්ථික ප්‍රතිසංස්කරණයන් ක්‍රියාත්මක වීම බවත් අරගලය ඒ වෙනුවෙන් යොදාගත යුතු බවත් පෙන්වමින් සිටියේය. ගෝඨා පන්නා රට අරාජික වීමට ඉඩ දී තවත් බරපතල අර්බුද මතු කර ගැනීමට වඩා ගෝඨා පාලනයට බලපෑම් කරමින් දේශපාලන හා ආර්ථික ප්‍රතිසංස්කරණයන් දිනා ගන්නා තෙක් අරගලය පවත්වා ගැනීම විය යුතු බව මේ අය පෙන්වා දෙන ලදී. නමුත් ඊට යහපත් ප්‍රතිචාර ලැබුණේ නැත. කොටින්ම මේ වන තුරුත් මේ අරගලකරුවන්ගේ සාකච්ඡාව බවට පත්ව ඇත්තේ පාලකයන් පන්නා දමා මහජන බලයක් ගොඩ නඟන්නේ කෙසේද යන්න ගැනය. ඒ අනුව එදා රාජ්‍ය පාලනය මේ අරගලකරුවන් අතට පත් වූයේ නම් සිදුවිය හැකිව තිබූ බරපතල තත්වයන් ගැන අවබෝධයක් ලබා ගත හැකිය. කෙසේ නමුත් සිදුවිය හැකිව තිබූ විනාශය ජනාධිපති ගෝඨාභය පවා වටහාගෙන සිටි අතර එය වැලැක්වීමට අවශ්‍ය පියවරයන් ගැනීමට සූදානම් විය. රනිල් වික්‍රමසිංහ අගමැතිවරයා ලෙස පත් කිරීම මෙන්ම දේශපාලන ආර්ථික ප්‍රතිසංස්කරණයන් වෙනුවෙන් යෝජනා වූ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහය ගැනීමේ සිට මූලික කරුණු කාරණා ඉටු කළ යුතු තැනකට ඔහු වෙනස්ව තිබිණි. කෙසේ නමුත් ඔහුට බලය පවත්වාගෙන යෑමට තරම් දේශපාලන පරිචයක් නොතිබීම සහ ඔහු වටා ඊට ගැලපෙන කණ්ඩායමක් නොසිටීමත් ආදී හේතු මත ඔහුට තනතුර අත් හරින්නට සිදු විය. අවසානයේ රනිල් වික්‍රමසිංහ බලය අත්පත් කරගැනීමට සමත්වීම තුළ රට අරාජිකවීම වැළැක්වුණු අතර ක්‍රමයේ වෙනසක් වෙනුවෙන් ඔහු දේශපාලන සහ ආර්ථික ප්‍රතිසංස්කරණයන් වෙත යොමු විය. ඔහු ගත් කඩිනම් පියවරයන් නොවන්න අද රට අමු සොහොනකට වඩා පත්වෙන්න වෙනත් තැනක් තිබුණේ නැත.


මෙම සිදුවීම් පෙළ යළි මතක් කළේ විපක්ෂයේ ඡන්ද ගාය නැවත උත්සන්නවීම නිසාය. පසුගිය කාලයේ පළාත් පාලන මැතිවරණය පැවැත්වීම වෙනුවෙන් රජයට දැඩි බලපෑමක් කරමින් සිටි අතර රටේ ආර්ථික ගැටළු සහ ඒ මොහොතේ ඡන්දය පැවැත්වූවා නම් විය හැකිව තිබූ දේශපාලන සහ ආර්ථික වියවුල ගැන වන අනතුර නිවැරදි ගණන් බැලීමක සිටි රජය මැතිවරණය කල් තැබීමට අවශ්‍ය පියවරයන් ගන්නා ලදී, කීම වඩා සත්‍යට ආසන්නය. එසේම පවතින පළාත් පාලන මැතිවරණ ක්‍රමයේ සහ ආයතන ව්‍යුහයේ ඇති අඩුපාඩු නිවැරදි කර ගැනීමකින් තොරව යළි මැතිවරණය පැවැත්වීම අර්ථාන්විත නොවන බවද රජය පෙන්වා දී තිබිණි. ඒ අනුව එම මැතිවරණ උණුසුම පහව ගිය අතර මේ වන විට යළිත් විපක්ෂය පළාත් සභා මැතිවරණය පැවැත්විය යුතු බව කියමින් නැවත තමන්ගේ ඡන්දගාය පෙන්වමින් තිබේ.

පළාත් සභා මැතිවරණය නියමිත පරිදි පැවැත්වීමට තිබූ කාලය පසුවී දැන් වසර පහකට ආසන්න කාලයක් වී ඇති නමුදු ඊයේ පෙරේදා ඡන්දගාය උත්සන්න වූයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය මුළුමනින්ම ක්‍රියාත්මක කිරීමට ජනාධිපතිවරයාගේ කැමැත්ත ප්‍රකාශ වීම සමඟය. 13 වන සංශෝධනය ක්‍රියාත්මක කිරීමේ දී පොලිස් බලතල ලබා දීම ගැන යම් ගැටළුකාරිත්වයකට මුහුණ දීමට සිදුවීම මත එය පාර්ලිමේන්තුවේ බහුතරයෙන් කැමත්ත ලබා ගත යුතු බවට ජනාධිපතිවරයාගේ යෝජනාව විය. එවැනි පියවරකට යන්නේ පොදු එකඟතාවයකින් ගැටුම් නිරාකරණය කරගැනීමෙන් අනාගතයේ විය හැකිව තිබෙන අනතුරු පාලනය කරගැනීමටය. කොහොම නමුත් විපක්ෂය 13 ක්‍රියාත්මක කිරීම ගැන යම් ප්‍රතිපත්තිමය එකඟතාවල සිටියත් දැන් ඊට ඉඩ නොදෙන බව කියමින් හෝ එය ක්‍රියාත්මක කිරීමට බාධා කරවන ලෙස කටයුතු කරමින් තිබේ. ඔවුන් රජයට බල කරන්නෙ 13 ක්‍රියාත්මක කිරීමට නම් පළාත් සභා මැතිවරණය පවත්වා තේරී පත්වන මහජන නියෝජිතයන්ගේ අදහස්ද සැලකිල්ලට ගෙන 13 ගැන තීන්දුවක් ගත යුතු බවය. මේක හරියට පතුල සිදුරු වී ඇති බව පෙනි පෙනීම මුට්ටියේ සිදුර වහන්න නම් යළි වතුර පුරවා සිදුර සොයා ගැනීම විය යුතු බව කියන්නා සේ වැඩකි. ප්‍රශ්නය ගැන පැහැදිලි අවබෝධයක් තිබියදී ඊට විසඳුමත් තිබියදී යළි ප්‍රශ්නය කුමක්දැයි සෙවිය යුතු නැත.

මේ විකාර අදහස ඔවුන් ගෙන එන්නේ මෙම ප්‍රශ්නය විසඳීමට තිබෙන මාර්ග අවහිර කිරීමට බව පැහැදිලිය. 13 සංශෝධනය හරහා පිහිටුවා තිබෙන පළාත් සභාවලට ව්‍යවස්ථාමය වශයෙන් ලැබිය යුතු වූ බලතල නොලැබීම සහ පළාත් සභා ක්‍රමයෙන් අපේක්ෂිත අරමුණු මෙතෙක් ක්‍රියාත්මක නොවීම නිසා පළාත් සභා යනු රාජ්‍ය මුදල් කාබාසිනියා කරන සුදු අලියකු බව බැහැර කළ නොහැකි සත්‍යකි. ඒ අනුව මේ අංග විකල දුර්වල පළාත් සභා ක්‍රමය යළි ක්‍රියාත්මක කිරීමෙන් අමුතුවෙන් ලැබෙන්න නියමිත දෙයක් නැත. ක්‍රමය නිවැරදි වන්නේත් නැත. විය යුතුව තිබෙන්නේ ක්‍රමයේ වැරැද්ද නිවැරදි කර පළාත් සභා පිහිටුවීමට අවශ්‍ය පියවර ගැනීමය. එසේ නොවුණහොත් වන්නේ අරගලයේ අපේක්ෂාව වූ ලෙස ගෝඨා පන්නා දැමීමෙන් පසුව අර්බුදය විසඳන්නට අවශ්‍ය කිසිවක් සිදු නොවී රට අරාජිකවන්නට ඉඩ තිබුණා මෙන්ම පළාත් සභා දැනට පවතින තත්වයෙන් ක්‍රියාත්මක කර, යළි ගැටළු වර්ධනය කර ගැනීම පමණි. මෙමඟින් ජාතීන්ගේ ප්‍රශ්නයට විසඳුමක් නොලැබෙන අතර, පළාත් සභා හරහා රටේ සංවර්ධනයට අවශ්‍ය ක්‍රියාකාරිත්වයත් සිදු නොවී තවත් කාලයක් යන තුරු ප්‍රශ්න කුරුවල් කරමින් සුදු අලියකු නඩත්තු කිරීමට ජාතික ධනය නාස්ති කිරීමත් පමණක් සිදු වෙනු ඇත. සිදුර වැසීමට අවශ්‍ය ප්‍රතිකර්ම ක්‍රියාත්මක කිරීමට ඉඩ නොලැබේ නම් අබලං මුට්ටිය විසිකර දැමිය යුතුය. ජනාධිපතිවරයා පළාත් සභා සම්බන්ධයෙන් කියන්නෙත් ඒ අදහසමය.

බොහෝ විට උතුරු නැගෙනහිර දේශපාලන පක්ෂවලට මෙන්ම දකුණේ විපක්ෂ පක්ෂවලටත් මෙම ප්‍රශ්නය විසඳීමට අවශ්‍ය නොවන්නේ මෙය හිඟන්නාගේ තුවාලය මෙන් තබාගෙන එය තමන්ගේ බඩගෝස්තර දේශපාලනය ඉදිරියට පවත්වාගෙන යෑමේ අභිලාශ පවතින නිසා විය හැකිය. විපක්ෂය තමන්ගේ විසඳුම මේ යැයි නිශ්චිතවම නොපැවැසීමට පරිස්සම් වීම තුළත් වෙන වටවංගු ගසමින් කැරකි කැරකී සිටීම තුළත් ඇත්තේ මේ තක්කඩිකමය. තමන්ගේ පාක්ෂික ජනතාවගේ පාක්ෂිකභාවය තවදුරටත් පවත්වාගෙන යෑමට නම් රටේ අර්බුද තිබිය යුතු අතර ඒ වෙනුවෙන් තමන් සතුව විසඳුම් තිබෙන බව මවා පෙන්විය යුතුය. උතුරු නැගෙනහිර බොහෝ පක්ෂවලට මෙම ප්‍රශ්නය විසඳුනහොත් ඊළඟට මුහුණ දෙන්න වන ගැටළුව වන්නේ එම ප්‍රදේශ සංවර්ධනය කර ජනතාවගේ ජීවන තත්වයන් උසස් කර යහපත් අනාගතයක් උදාකරලීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමය. දැනට එම ප්‍රදේශවල කිසිදු ප්‍රශ්නයක් නොවිසඳෙන්නේ 13 හරහා බලය ලබාදීමක් නොවන නිසා බව ඔවුන් ජනතාවට පෙන්වා තිබෙන චිත්‍රයයි. ඒ චිත්‍රය ඉවත්වීම මත ඇත්ත ප්‍රශ්නවලට ඔවුන්ට මුහුණ දීමට සිදුවේ. කොහොම නමුත් ජනාධිපති රනිල් 13 පිළිබඳ ගැටළුව නිරාකරණය කිරීම ගැන පැහැදිලි ස්ථාවරයක සහ අධිෂ්ඨානයක සිටින තත්වය තුළ සහ උතුරු නැගෙනහිර පළාත් සංවර්ධනය වෙනුවෙන් විශාල ක්‍රියාමාර්ග රැසක් ගෙන තිබෙන තත්වය තුළ තමන්ට දේශපාලන භූමිය අහිමි වෙනවා කියන බිය එම පක්ෂවලට තිබේ. ඉන්දියාව සමඟ ජනාධිපති පසුගියදා එකඟවූ ආර්ථික සහසම්බන්ධතාවය ගොඩනැගෙන විට වඩාත්ම වේගවත් සංවර්ධනයක් අත්පත් කර ගනු ඇත්තෙත් මේ දෙපළාත වෙනු ඇත. මෙම සංවර්ධන ක්‍රියාදාමය තුළින් එම දෙපළාත් ජනතාවට බලය පිළිබඳ ගැටළුවද පැන නැඟීමේ ඉඩ ඇහිරෙනුද ඇත. මේ තත්වයන් තුළ අර්බුද වවාගෙන කන පක්ෂවලට මාරාන්තිකවීම නොවැළැක්විය හැකිය. මේ වන විට 13ට එහා ගිය පෙඩරල් විසඳුමක් අවශ්‍ය බවට කන්කෙදිරි ගෑමක් සිදු වන්නේ ඒ නිසාය. පෙඩරල් අවශ්‍ය නෑ 13 දුන්නාම ඇතිය කියන ස්ථාවරයෙන් එහාට යන්න උත්සහ කරන්නේ අලුත් ප්‍රශ්නයක් නොමැතිව පැවැත්ම අහෝසි වන නිසාය.

මේ අතර දෙමළ ජාතික සන්ධානය ඉන්දියාව හරහා ජනපති රනිල්ට බලපෑම් කිරීමට ගන්නා උත්සාහයක්ද ක්‍රියාත්මක වෙයි. එහෙත් ඉන්දියාව තවදුරටත් පසුවන්නේ මේ දෙමළ ජාතික සන්ධානයේ පැවැත්ම පිළිබඳ ප්‍රශ්නය විසඳීමට මැදිහත් නොවන තැනකය. 13 ක්‍රියාත්මක කිරීම ගැන රනිල් ගෙන තිබෙන ස්ථාවරයෙන් ඉන්දියාව ඉවත් නොවෙනු ඇත. මේ ප්‍රශ්නය තවදුරටත් වණ කරමින් ලංකාවට බලපෑම් කරමින් තමන්ගේ කලාපීය වුවමණාවන් සහ ගෝලීය භූ-දේශපාලනික වුවමණාවන් සපුරා ගන්නට නොහැකි බව ඉන්දියාවට අවබෝධයක් තිබේ. නරේන්ද්‍ර මෝදි අද කලාපීය එකමුතුවත් ගොඩනගා ගෝලීය වශයෙන් දේශපාලන සහ ආර්ථික පිම්මක් පැනීමට සැරසීම යුද්ධයක් ලෙස හැඳින්විය හැකි, නම් අද එහි ප්‍රධාන අණ දෙන නිලධාරියා වී ඇත්තේ රනිල් වික්‍රමසිංහය. පසුගිය කාලය තුළ ලෝකයේ බටහිර කොණටත් නැගෙනහිර කොණටත් යමින් රනිල් මෙම මෙහෙයුමේ යෙදී සිටියේය. ප්‍රංශ ජනාධිපතිවරයා, ජපන් විදේශ ඇමැතිවරයා, චීන කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රබලයෙක් ඇතුළු ලෝක සංවිධාන ගණනාවක් නියෝජිතයන් එක පෙළට මෙරටට පැමිණියේ තෙල් ගහගෙන යෑමට නොවන බව ජාත්‍යන්තර දේශපාලනය ගැන අවබෝධයක් තිබෙන අයට අමුතුවෙන් පැහැදිලි කළ යුතු නැත. මේ නිසා ඉන්දියාව මේ මොහොතේ වැඩ කරමින් සිටින්නේ රනිල් වික්‍රමසිංහ සමඟ මිස පටු දේශපාලනික වුවමණාවන් මත සිල්ලර වැඩකරමින් සිටින වුන් සමඟ නොවේ. මේ නව තත්වයන් ගැන මෙරට දකුණේ විපක්ෂ දේශපාලන පක්ෂවලටත් අවබෝධයක් නැත. තවම කල්පනා කරන්නේ ජාතික ප්‍රශ්නය දඩමීමා කර ගනිමින් තවදුරටත් තමන්ගේ පැවැත්මට මොන මොනවා හෝ කරගත හැකි බවය.



සජිත් ප්‍රේමදාසට තිබෙන ගැටළුව ජාතික ප්‍රශ්නය විසඳුනහොත් ජාතිකත්වයන් මත ගොඩනැඟී ඇති සුළු පක්ෂවල සහය තමන්ට ලබා ගැනීමට තිබෙන හැකියාව අහිමි වන බව දැනගෙන සිටීමය. සජබය මීට පෙර 13 මුළුමනින්ම ක්‍රියාත්මක කළ යුතු බවට ප්‍රතිපත්තිමය තීන්දුවක සිටියේ සුළු පක්ෂවල සහය ලබාගැනීම වෙනුවෙනි. අද ඒ ගැන කිසි කතාවක් නොමැතිව ප්‍රශ්නය විසඳන්න නම් පළාත් සභා මැතිවරණය පැවැත්විය යුතු බවට පදනමක් නැති කතාවක් එළියට ඇද ගන්නේ ප්‍රශ්නය නොවිසඳෙන තැනට කටයුතු කර තවත් කාලයක් අල්ලගෙන යා යුතු බැවිනි. එය පැහැදිලිය. මේ අතර ජනතා විමුක්ති පෙරමුණත් අලි අමාරුවක් වැටී සිටී. ජවිපෙ පතුරු සංවිධානයක් වන ජාතික ජන බලවේගය නියෝජන කරන මන්ත්‍රීවරිය වූ හරිනි අමරසූරිය 13 සංශෝධනය, පවතින ව්‍යවස්ථාමය නීතියක් බවත් එය මුළුමනින්ම ක්‍රියාත්මක විය යුතු බවත් කියා ඉන් නොනැවතී ඊට එහා ගිය යමක්ද සිදු විය යුතු බව පවසා තිබිණි. නමුත් එය ජනතා විමුක්ති පෙරමුණ දේශපාලනිකව අර්බුදයට යවන ප්‍රකාශයක් විය. ජවිපෙ සිය ඊනියා ජාතිකවාදී දේශපාලනය පවත්වාගෙන යන්නේ දෙමළ විරෝධය පදනම් කරගත් ස්ථාවරයක සිටිමින්ය. ඒ අනුව 13 දීමට එකඟවුවහොත් තමන්ගේ ඉතිරිව සිටින ඡන්දදායකයාත් අහිමි වේ යැයි බියක් ඇතිවීම ස්වභාවිකය ඊටත් වඩා පක්ෂ සාමාජියන් දසදහස් ගණනක් දිවි පිදුවේ 13 සංශෝධනයට මග පෑදූ ඉන්දු ලංකා ගිවිසුමට එරෙහිවය. ඒ අනුව 13ට පක්ෂවීම පක්ෂය වෙනුවෙන් දිවි පිදුවන්ට කරන බරපතලම ද්‍රෝහීකමක්, අපහාසයක්වීම වැළැක්විය නොහැක. මේ නිසා 13 ක්‍රියාත්මක කිරීමට කිසිසේත්ම සහය නොවන බවට ප්‍රකාශයක් කරන්නට සිදු විය. නමුත් විහිළුව නම් ජවිපෙත් පළාත් සභා මැතිවරණය පැවැවීම විය යුතු බවට ගෝරණාඩුවක යෙදී සිටීමය. පළාත් සභා සුදු අලියකු බවත් එය අහෝසි කළ යුතු බවත් පෙන්වා දීමට සිය දේශපාලනය තුළ වැඩිම කාලයක් අරගත්තේද ජවිපයය. එහෙත් නැවත මේ සුදු අලියාව නැගිට්ටවීමට අවශ්‍ය වන්නේ ප්‍රශ්නය වවාගෙන කමින් තළුමරමින් කාලය ගත කිරීම හැර වෙන විසඳුම් නැති නිසාය. මේ ගැන හරිනි අමරසූරියලාත් දැන් නිහඬය. ජාතික ජන බලවේගය මතින් ලිබරල් ප්‍රජාතන්තන්ත්‍රවාදී මතයක් පෙන්වා මධ්‍යම පාන්තිකයන් දිනාගැනීමේ ජවිපෙ ව්‍යාජ රැවටිලිකාර දේශපාලනයත් මෙමඟින් යළි හෙළිදරව් වී ඇත.

කොහොම නමුත් මේ දක්වා කාලය තුළ පෙන්නුම් කර ඇත්තේ රටේ මතුවන අර්බුද හෝ අර්බුද මවමින් හෝ විපක්ෂය කටයුතු කරමින් සිටින්නේ තම තමන්ගේ හුදු පැවැත්ම වෙනුවෙන් බවය. නමුත් අද රටට අවශ්‍ය වන්නේ රටේ පැවැත්ම ගැන හිතන, ජනතාවගේ පැවැත්ම ගැන හිතන, පරිණත දේශපාලන නායකත්වයකි. ජනපති රනිල් සපුරා ඇත්තේ ඒ ඉඩකඩය. ඊනියා අරගල අවසන් වන්නෙත් විපක්ෂයේ තක්කඩිකම්වලට ඉඩක් නොලැබෙන්නේත් ඒ අනුවය.

සෝෂක

# විසඳිය යුත්තේ දෙමළ ජනතාවගේ ප්‍රශ්නද පක්ෂවල ප්‍රශ්නද?



"අතට ගත් දේ කටට දාගන්න පින නෑ" යන්න ගැමි වහරේ ප්‍රසිද්ධ කියමනකි. මේ අතට ගත්තේ කුමක්ද? කටට දාගන්න බැරි වුනේ කුමක්ද? එසේ බැරි වෙන්න හේතුව කුමක්ද? යන ප්‍රශ්නවලට අප මේ ලිපිය තුළ සෙමින් කරුණු සොයාගනිමු. දශක තුනකට ආසන්න කාලයක් උතුරු නැගෙනහිර පළාත් කේන්ද්‍ර කරගෙන යුද්ධයක් පැවතුණි. මෙම යුද්ධයට පදනම වැටෙනුයේ එම දෙපළාතේ දෙමළ ජාතික ජනතාවට ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් දිනා ගැනීම අරඹයා බව අප දන්නා කතාවය. කෙසේ නමුත් එම ප්‍රශ්නයට විසදුමක් ලෙස ගෙන ආ බලය බෙදාහැරීමක් සඳහා වන 13 වන ව්‍යවස්ථා සංශෝධනය මෙතෙක් මුළුමනින්ම ක්‍රියාත්මක කිරීමට විධායක ජනාධිපතිවරු හත් දෙනෙකුගේ ඇවෑමෙන් පසුත් නොහැකිව ඇත්තේ ජනතාවගේ වරදකින්ද? දේශපාලනඥයින්ගේ වරදකින්ද? යන්න විමසිය යුතුය.

කාලාන්තරයක් තිස්සේ වේදනා දෙමින් ඇදෙන මේ තුවාලයට විටින් විට පත්වන පාලකයන් බෙහෙත් කරන්නට වෑයම් කළේය. ඒ ඒ පාලනයන් බලයට පත් වන විට 13න් එහාටද බලය බෙදා දෙන බවට පොරොන්දු වෙමින් දෙමළ ජනතාවගේ ඡන්දය කොල්ල කෑ අවස්ථාද තිබිණි. එහෙත් මැතිවරණයෙන් පසු එම ප්‍රශ්නය අත්හැරියේය.

තවත් පැත්තකින් උතුරේ ජනතාවට මෙම අයිතීන් දිනා දීමට උතුරු නැගෙනහිර දේශපාලන පක්ෂ ද බාධාවක් වූ බවත් පැහැදිලි කතාවකි. ඒ ඒ පක්ෂවල දේශපාලන න්‍යාය පත්‍ර හා පක්ෂ අතර වන බල අරගලයේ පොළා පැනීම්හි ප්‍රතිඵලයක් ලෙස ලැබෙන්න තියෙන දේශපාලන විසදුම් කල් දැමීමට මිස එය එකමුතුව විසදා ගැනීමේ ඉමකට තල්ලු වූයේ නැත. ජනාධිපති රනිල් වික්‍රමසිංහ බලයට පත්ව තම මූලික කාර්යයක් ලෙස උතුරේ ජනතාවට දේශපාලන විසඳුමක් සඳහා වන 13 වන ව්‍යවස්ථා සංශෝධනය සම්මත කිරීම සඳහා සර්ව පාක්ෂික කමිටුවද, උතුරේ දෙමළ ජනතාව නියෝජනය කරන පක්ෂද එක්ව දීර්ඝ සාකච්ඡා වට ගණනාවක් පැවැත්වීය. ආණ්ඩු පක්ෂයේ කොළ එළි දල්වා තිබියදී දෙමළ ජාතික සන්ධානය ප්‍රමුඛ උතුරේ දෙමළ පක්ෂ ගැටළුව විසඳා ගැනීමෙන් කර ඇරීමට පොටක් සොයමින් සිටී. දකුණේ බොහෝ දේශපාලන පක්ෂ ජනාධිපතිවරයාගේ මැදිහත්වීමෙන් යම් සාධනීය තැනකට රැගෙන විත් ඇති විටක දැන් 13ට එහා බලයක් සොයමින් මෙසේ දෙමළ පක්ෂ හා එහි නායකයන් කටයුතු කිරීම තවදුරටත් මේ තුවාලය පවත්වාගෙන යාමට ඔවුන් ක්‍රියාත්මක වන්නේද යන්න සැකයට තුඩු දී ඇත.

## ගැටළුවේ දිගුව

ජනාධිපති රනිල් වික්‍රමසිංහ තමා ජනාධිපති ධූරයට පත්වීමෙන් පසුව 13 වන ව්‍යවස්ථා සංශෝධනය බලාත්මක කිරීම සඳහා තීන්දු කරනු ලැබුවේ ආවට ගියාට නොවේ. දෙමළ සන්ධානය හා උතුරේ පක්ෂ සමඟ මෙන්ම සර්ව පාක්ෂික කමිටුව එක් රැස්වී සාකච්ඡා වන අවස්ථාවන්හි ඔහු මේ සම්බන්ධයෙන් කරුණු කාරණා ඓතිහාසිකව දැන සිටියේය. බලය බෙදීම සඳහා ගත් පියවරයන් බල දේශපාලනයේ කෑදරකමින් යටපත් වූ අවස්ථා ඔහු අත් දැක ඇත්තේය. බලය බෙදා හැරීමේ ක්‍රමවේදය ගැන සාකච්ඡාව දැන් සියවසක් තරම් පැරණිය. ප්‍රශ්නයට ෆෙඩරල් විසඳුමක් මුලින්ම යෝජනා කළේ එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායකය.

එවකට තරුණ නීතිඥවරයකු වූ බණ්ඩාරනායක යාපනයේ පැවැති රැස්වීමකදී ප්‍රකාශ කළේ, **"ලංකාවේ එක් එක් පළාතකට සම්පූර්ණ ස්වයං පාලන අයිතිය තිබිය යුතු ය. දිවයිනේ විශේෂ ආදායම් වියදම් ගැන තීරණය කිරීමට මන්ත්‍රණ සභා එකක් හෝ දෙකක් තිබිය යුතු ය. මේ ක්‍රමයට විරුද්ධව දහසකුත් එකක් තර්ක ඉදිරිපත් විය හැකි වුවත් එම විරුද්ධතා අඩු වී ගියාට පසු ෆෙඩරල් ආණ්ඩු ක්‍රමය ලංකාවට තිබෙන එකම විසඳුම බවට පත්වනු ඇත."** 1926 ජූලි 17දා සිලෝන් මෝනිං ලීඩර් පුවත්පතේ මෙම ප්‍රකාශය පළ විය. නමුත් බණ්ඩාරනායකටම පවා පටු දේශපාලන වුවමනාවන් වෙනුවෙන් මේ විසඳුමෙන් ඉවත් වන්නට සිදු විය. නමුත් මේ ප්‍රශ්නය විසඳන්නට මෙන්ම අවුල් කරවීමටත් රජය යම් යම් කාලවල ගත් නෛතික ක්‍රියා මාර්ග හේතු විය. 30 අවුරුදු යුද්ධය යනු මේ සියල්ලේ නරකම ප්‍රතිඵලයයි.

කොහාම නමුත් අවසන් වරට ගත් උත්සාහය 1987 ඉන්දු ලංකා ගිවිසුම ප්‍රකාරව 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් පළාත් සභා පිහිටුවීමය. එහිදී මධ්‍යම රජය සතුව පැවති බලය මධ්‍යම රජය සහ පළාත් සභා සඳහා ලැයිස්තු තුනකින් යුතුව බලය බෙදී යන ආකාරයට සැලසුම් කරනු ලැබීය. නමුත් එය පිහිටවනු ලැබූ දින සිට වර්තමානය මධ්‍යම රජය විසින් පළාත් සභා ලැයිස්තුව තුළ අන්තර්ගත බලය මුළුමනින්ම පළාත් සභා සඳහා ලබා නොදුන් අතර පළාත් සභා ඉඩම් හා පොලිස් බලතල ඒ අතර ප්‍රධාන විය.

කෙසේ හෝ නියමිත වෙදකමක් නොකිරීම මත ඔඩු දුවපු තුවාලයට විසදුම් සෙවීමේ ක්‍රියාවලිය වර්තමාන ජනාධිපතිවරයා දක්වා ඇදී ආවේය. මේ වන විට සාකච්ඡා වට ගණනාවක් දෙමළ පක්ෂ නියෝජිතයින් සමඟ ද දකුණේ දේශපාලන පක්ෂ එක්ව සර්ව පාක්ෂික සාකච්ඡාවක් ලෙස ද සිදු කළේය. 2023 ජනවාරි 26 වැනිදා පැවැත්වූ සර්ව පාක්ෂික සමුළුව, පෙබරවාරි මස 03 වනදා දෙමළ ජාතික සන්ධානය සමඟ සාකච්ඡාව, මැයි මස 09 වනදා දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරුන් සමඟ සාකච්ඡාව, මැයි 11, 12 සහ 13 දිනවල උතුරු පළාත නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අතර සාකච්ඡාව, ජූනි 08 වැනිදා දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරුන් අතර තීරණාත්මක විශේෂ සාකච්ඡාව, ජූලි මස 18 දින උතුරු නැගෙනහිර දෙපළාත නියෝජනය කරන දමිළ මන්ත්‍රීන් අතර සාකච්ඡාව, ජූලි මස 26 දින සර්ව පාක්ෂික සමුළුව වැනි සාකච්ඡාවන් මගින් මෙම ගැටළුවේ සාධනීය අන්තයක් දක්වා රැගෙන ඒමට ජනාධිපතිවරයාට ඔහුගේ පැත්තෙන් හැකි වී ඇත.

මීළඟ පියවර කරා යෑමේ වගකීම ඇත්තේ අනෙක් පක්ෂ, විශේෂයෙන්ම දෙමළ පක්ෂ හා ඔවුන්ගේ අන්තේවාසිකයන්ගේ අතේය. අවසන් විසඳුමකට පැමිණීමෙන් අනතුරුව විය යුතු නෛතිකමය කටයුත්ත පාර්ලිමේන්තුව හමුවට ඉදිරිපත් කිරීමට නියමිතය.

## මස් රාත්තලම ඉල්ලන දෙමළ නායකයින්

13 වන ව්‍යවස්ථා සංශෝධනය සම්මත කිරීම සඳහා තමාගේ පැත්තෙන් විය යුතු දේ උපරිමයෙන් සිදු කරන බවට පසුගියදා ජනාධිපතිවරයා සඳහන් කොට සිටියේ **"උතුරු හා නැගෙනහිර ජනතාවගේ ගැටලු විසඳීමට අදාළ හොඳම යෝජනාවලිය මා විසින් ඉදිරිපත් කළා. එය ඉදිරියට ගෙන යනවාද නැද්ද යන්න ද්‍රවිඩ පක්ෂ නායකයන් තීරණය කළ යුතුයි. මට අවශ්‍ය උතුරු නැගෙනහිර ද්‍රවිඩ ජනතාවගේ ගැටලු විසඳීම මිස ඉන් දේශපාලන ප්‍රතිලාභ ලබා ගැනීම නොවෙයි. එම නිසා පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු පක්ෂ නායකයින් පූර්ණ බලය බෙදීමකට එකඟ වන්නේ නම් පමණක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය පූර්ණ වශයෙන් බලාත්මක කළ හැකිය. මා උතුරු හා නැගෙනහිර ජනතාවට කිසිඳු අවස්ථාවක අසාධාරණයක් සිදු නොකරන අතර මීට වඩා යමක් ඔවුන් වෙනුවෙන් සිදු කිරීමට නම් ඒ සඳහා පාර්ලිමේන්තුවේ පූර්ණ සහයෝගය සාකච්ඡාවෙන් සහ සම්මුතියෙන් ලබා ගත යුතුයි. පොලිස් බලතල අවශ්‍ය නම් එය ලබා දීමට මා එකඟ වන අතර නමුත් එය පාර්ලිමේන්තුව හමුවට ඉදිරිපත් කොට 2/3ක බහුතරයකින් සම්මත කර ගත යුතු වෙනවා"** යන්නය. මේ අනුව ජනාධිපතිවරයා විසින් උතුරේ ජනතාව සඳහා ලබා දිය හැකි හොඳම විසඳුම් ක්‍රියාවලිය ඉදිරිපත් කොට ඇති බැවින් මෙහිදී අනෙකුත් පාර්ශ්වයන්ට ඒ වෙනුවෙන් වන කැපවීම අනිවාර්යය බව පෙන්නුම් කරයි.

එහෙත් මේ සාකච්ඡාවන් සම්බන්ධයෙන් දෙමළ පක්ෂ නායකයින් දරණ මතයන් වන්නේ පූර්ණ බලය බෙදීමකට යා යුතු ය යන්නය. දෙමළ සන්ධානයේ පාර්ලිමේන්තු මන්ත්‍රී එම්. සුමන්තිරන් සඳහන් කොට සිටින්නේ, **"අපගේ ස්ථාවරය ව්‍යවස්ථාව එයයි. වසර 35කට පසුවත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමෙන් ඵලක් නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක කරන බව සෑම රජයක්ම ප්‍රකාශ කිරීම විකාරයක්. අපි ඔවුන්ට කිව්වා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැනටමත් පවතින බලය බෙදාගැනීම සම්බන්ධයෙන් සියලු විධිවිධාන ක්‍රියාත්මක කරන්න. එය 13 වැනි සංශෝධනය විය හැකිය, 16 වැනි සංශෝධනය (පරිපාලන භාෂා) හෝ කුමක් හෝ විය හැකිය - බලය බෙදාගැනීම සම්බන්ධ සියලු විධිවිධාන ක්‍රියාත්මක කර නොමැති නිසා වහාම ක්‍රියාත්මක කළ යුතුය. ඒ සඳහා ඔබට කාලය අවශ්‍ය නැහැ, කළ යුතු දේ පමණක් කරන්න පුළුවන්"** යන්නය.

දෙමළ සන්ධානයේ නායකයින් මස් රාත්තලම අවශ්‍ය බව හඟවන්නේ තවදුරටත් ප්‍රශ්නය වවාගෙන කෑමට බව පැහැදිලිය. හුදු දේශපාලන ගැටුමක් නිර්මාණය කර ගනිමින් ජනාධිපතිවරයා එකඟවූ ලෙස දෙමළ ජනතාවට ලැබීමට නියමිත වන අයිතිය තවදුරටත් කල් දමමින් විනාශ කර දැමීම මිස මෙයින් වෙනකක් සිදු නොවේ. මේ අස්සේ පළාත් සභා මැතිවරණය පවත්වන ලෙස ඉල්ලීමද ප්‍රශ්නය නොවිසඳෙන තැනට තල්ලු කිරීමට ගන්නා උත්සාහයක් මිස වෙනකක් නොවේ. මේ අතර ජනාධිපතිවරයා උතුරු නැගෙනහිර වෙනුවෙන් ක්‍රියාත්මක කිරීමට යෝජනා කළ සංවර්ධන ව්‍යාපෘති ගැන ද මේ පක්ෂ පසුවන්නේ විවාදයකය.

ඒ අතර දෙමළ දේශපාලන පක්ෂ අතර වන තමන්ගේ ගොඩ වැඩිකර ගැනීමේ ගැටුමට අමතරව ප්‍රභූවාදය, කුල හා ප්‍රාදේශීය බෙදීම් ද ඔවුන්ට එක මතයකට පැමිණීම වළක්වා තිබේ. හිටපු මහ ඇමති විග්නේෂ්වරම් පසුගියදා පුවත්පතකට සම්මුඛ සාකච්ඡාවක් ලබා දෙමින් සඳහන් කොට සිටියේ **"අපි තවම ඉල්ලන්නේ පොලිස් බලතලත් ඇතුළත් 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කරන්න කියලා. උතුරු නැගෙනහිර පදනම් කරගත් දේශපාලන පක්ෂවල සමස්ත ස්ථාවරය එයයි"** යන්නය. නමුත් එය අදියර ලෙස ක්‍රියාත්මක කරමින් එහි වර්ධනයන් සමඟ ඉදිරි පියවර ගැනීමේ හැකියාව ඇති බව පවසා තිබිණි. එය වඩා ප්‍රායෝගික හා ගැටුම් අවම කරන යෝජනාවක් වුවද ඊට දෙමළ ජාතික සන්ධානය එකඟ නැත. ඔහු චෝදනා කරන්නේ මේ ප්‍රශ්නය හිඟන්නාගේ තුවාලය මෙන් පවත්වාගෙන යෑමට උත්සාහ කරන බවය.

මේ තත්වයන් මත ජනාධිපතිවරයා අවධාරණය කර සිටියේ මුළින් උතුරු නැගෙනහිර ජනතාව නියෝජනය කරන පක්ෂ එක මතයකට පැමිණෙන ලෙසය. එහෙත් මෙතෙක් එවැනි උත්සාහයක් වෙනුවෙන් සාකච්ඡාවක් යෝජනා කිරීමට හෝ පියවර ගෙන නැත.

මේ පිරිස සිදු කරන දේ සම්බන්ධයෙන් පසුගියදා සුරේන් රාඝවන් ඇමතිවරයා කදිම අදහසක් පළ කළේය.

**"දෙමළ දේශපාලන ප්‍රභූ පැළැන්තිය අතර ද අසමගියක් තිබෙනවා. ඔවුන් විවිධ මත දරණවා. ඇතැමුන් ෆෙඩරල්වාදයෙන් තොරව කිසිදු විසඳුමක් පිළිනොගෙන සාකච්ඡාවෙන් බැහැරව සිටිනවා. ඇතැමුන් විසඳුමක් ඉල්ලා සිටි විට ඒ වෙනුවෙන් කටයුතු නොකර සිටිනවා. ඉතින් ඔවුන්ගේ සද්භාවය ඒ ජාතියට ගැටලුවක්ව තිබෙනවා.**

**13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය බලාත්මක කළ යුතුයි. එය තවදුරටත් කල්දැමිය යුතු නැහැ. මහින්ද රාජපක්ෂ මහතා සමඟ සාකච්ඡා කළ අන්දමට 13+ අවශ්‍ය බව යෝජනා කරන පක්ෂ ද සිටිනවා. පළාත් සභා ඡන්දය කල්දමා මේ මොහොත වන විට වසර හතකට ආසන්න කාලයක් ගතව තිබෙනවා. එසේ නම් ඒ මැතිවරණය පැවැත්විය යුත්තේ මේ ගැටලුව නිරාකරණය කරගෙනයි. පොලිස් බලතල ලබාදිය යුතුද යන්න ගැන සංවාදයක් තිබෙනවා. 13වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ පොලිස් බලතල සඳහන්ව තිබුණත් එකිනෙකා අතර ඇති සැක සංකා හේතුවෙන් එය ක්‍රියාත්මක කර නැහැ. දෙමළ කතා කරන ජනතාවගේ 95%කගේ ප්‍රශ්නය තමයි දෛනික ජීවත්වීමේ අරගලය. එය විසඳිය යුතුයි. ඒ වගේම දෙමළ නායකයන් අතරද ප්‍රශ්න තිබෙනවා. නමුත් ඔවුන් අතර තිබෙන එම විරසකය අප දේශපාලන වාසි ලබා ගැනීමට භාවිතා නොකළ යුතුයි. මෙහිදී වැදගත් වන්නේ දෙමළ ජනයාගේ හදවත් දිනා ගැනීමට කටයුතු කිරීමයි"**

උතුරු නැගෙනහිර ජනතාව මුහුණ දෙන ගැටළුව සහ එම දේශපාලන පක්ෂවල ගැටළුව එකක් නොව දෙකක් බව පැහැදිලිය. ජනාධිපතිවරයා උත්සාහ ගන්නේ දෙමළ කතා කරන පුරවැසි ජනතාවගේ ගැටළුව විසඳීම ප්‍රමුඛ කාරණය ලෙස ගෙන විසඳුමකට අවතීර්ණය වීමටය. ඇතැම් විට දෙමළ දේශපාලන පක්ෂ කල්පනා කරන්නේ දෙමළ ජනතාවගේ ප්‍රශ්න විසඳීම ඔවුන්ට පමණක් හිමි අයිතියක් ලෙස ගෙන විය යුතුය. ජනාධිපතිවරයාට ප්‍රශ්නය විසඳන්නට සහය නොලැබීම ඒ අනුව සිදු වෙනවා විය හැකිය.

මේ අතර දකුණේ ඇතැම් දේශපාලන පක්ෂද විශේෂයෙන්ම සජබය කල්පනා කරන්නේ ජනාධිපතිවරයා මේ ප්‍රශ්නය විසඳුවහොත් තමන්ට යන කලදසාව ගැනය. මන්ද ජාතික ප්‍රශ්නය යනු ජාතිවාදය සමඟ හොඳටම වවාගෙන කෑ හැකි ප්‍රශ්නයක් නිසාය. මේ අය උතුරට ගොස් කියන එක දකුණේ දී කියන්නේ නැත. ප්‍රශ්නය විසඳන්න නිශ්චිත විසඳුමක් යෝජනා කරන්නේ නැත. එහෙම සාකච්ඡාවක් ද ඔවුන්ට නැත. කිසිදු පදනමක් නැති බහුභූත කියවමින් එකඟතාවයකට පැමිණීම මඟ හරිමින් සිටින්නේ ඒ නිසාය.

කොහොම නමුත් කාගේ කවර බාධා කිරීම් සිදු වුවත් මේ ප්‍රශ්නය අවසානය දක්වා ගෙන යන බව ජනාධිපතිවරයා වෙතින් අවධාරණය කෙරිණි. එක්කො 13 බලාත්මක විය යුතුය නැති නම් අහෝසි කර වෙනත් විසඳුමකට යෑම විය යුතුය. ඒ කවරක් වුවත් ඔහුට මෙහි ගන්නා පෞද්ගලික හෝ දේශපාලන වාසියක් නම් නැත. ඔහුට අවශ්‍ය වන්නේ සමස්ත පුරවැසියාටම සම අයිතිවාසිකමක් කිව හැකි ශ්‍රී ලංකාවක් පමණි.

කේ.පී.අයි. ප්‍රියංගනී

# කොහොම කළත් තියෙන හොඳම විකල්පය ගන්න – ජනපති

## Mr. President

### සතියට රටවල් පහක් එකතැන

විදෙස් රාජ්‍ය නායකයන් අතර ගෙවුණු ඉකුත් සතිය ලංකා ඉතිහාසයේ ජනාධිපතිවරයෙකු ලද සුවිශේෂී අත්දැකීමක් විය. රාජ්‍ය ප්‍රධානින් පස් දෙනෙකු සතියක් තුළ මුණ ගැසීමේ භාග්‍ය ජනපති රනිල් වික්‍රමසිංහට උදා වූවේය. අගමැති මෝදිගෙන් පටන් ගෙන ජපන් රාජ්‍ය ඇමති ෆුජිමාරු දක්වා විදෙස් රාජ්‍ය ප්‍රධානීන් ජනපති රනිල් මුණ ගැසුණේ දින 10ක් තරම් කෙටි කාලයක් තුළදීය.

ජනපති රනිල් ඉකුත් සෙනසුරාදා අළුයම ප්‍රංශ ජනාධිපති එම්මානුවෙල් මැක්‍රෝන් මුණ ගැසී පැය කිහිපයක් ගත වූ එදිනම උදෑසන ජපන් විදේශ ඇමති හයාෂි යොෂිමාසා මුණ ගැසුණේ සිය නිල නිවසෙදීය. සඳුදා දිවා කාලයේ තවත් ජපන් දූත පිරිසක් ජනපති මුණ ගැසීමට පැමිණ සිටියේ ලේකම් කාර්යාලයටය.

ඒ ජපානයේ කැබිනට් කාර්යාලයේ රාජ්‍ය අමාත්‍ය ෆුජිමාරු සටෝෂි සහ ප්‍රාදේශීය පුනර්ජීවනය පිළිබඳ හිටපු රාජ්‍ය ඇමති යමමොටෝ කොසෝ ය. ඔවුන් වත්මන් ජපන් අගමැතිගේ දේශපාලන පක්ෂය නියෝජනය කරන අය වීම විශේෂත්වයකි.

අතරමඟ ඇනහිට ඇති ජපන් ආයෝජන ගැන ඔවුන් ජනපති හා සාකච්ඡා කළෝය. මේ අතර එදින උදෑසන ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානි සාගල රත්නායක ජනපති මුණ ගැසුණේ ඒ වනවිට රට තුළ උද්ගතව පැවැති ගැටළුවක් සිහිපත් කිරීමටය.

### විදුලිය එකට

"සර් හම්බන්තොට සහ මොණරාගල අතර ගොවීන් පිරිසක් ජල හිඟයකට මුහුණ දීලා ඉන්නවා. කෘෂිකර්ම අමාත්‍යාංශය මේ අයට වගා කරන්න සමනල වැවෙන් වතුර ඉල්ලනවා. විදුලිබල මණ්ඩලය ඒකට කැමති නෑ. එයාලා කියන්නේ වතුර දුන්නොත් දිස්ත්‍රික්ක පහකට පැය 3 ක් විදුලිය කපන්න වෙනවා කියලායි." කාර්ය මණ්ඩල ප්‍රධානි සාගල කීවේය.

"මේ මොහොතේ විදුලිය කප්පාදුවකට යන්න බෑ. අනෙක් පැත්තෙන් ගොවීන් අත් හරින්නත් බෑ. නමුත් ගන්න තියෙන හොඳම විකල්පය අපිට ගන්න වෙනවා." ජනපති අදහස එය විය.

"වගා හානි වුනොත් ගොවීන්ට වගා වන්දි ගෙවන්න පුළුවන්. විදුලිය නතර කළොත් කර්මාන්ත ආදී ක්ෂේත්‍ර ගණනාවකට හානි වෙනවා." ඇමති කංචන කීවේ එවැන්නකි.

"මෙතන තව ප්‍රශ්නයක් තියෙනවා. මේ දිස්ත්‍රික්ක 5ක් ප්‍රධාන පද්ධතියට සම්බන්ධ වෙලා නෑ. වසර කිහිපයක් තිස්සේ සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම් කරන්න බැරිව ඉන්නවා එක පුද්ගලයෙක් නිසා." සාගල යළි කතා කළේය.

"කොහොම කළත් හොඳම විකල්පයට යන්න. ඒ විකල්පය මට දෙන්න මොකක් වුනත් ඒක කැබිනට් එකට දාලා අනුමත කරගන්න වෙනවා." ජනපති උපදෙස් දුන්නේය.

කාර්ය මණ්ඩල ප්‍රධානි සාගල රත්නායක කැඳවූ ජනපති රනිල් ඔහුට තවත් රාජකාරියක් භාර දුන්නේය. ඒ අස්වැසුම වැඩසටහන හා සමෘද්ධිය අතර තිබෙන ගැටළුව විසඳීමය. ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානි සාගල මුදල් රාජ්‍ය අමාත්‍ය ශෙහාන් සේමසිංහ හා එක්වී වැඩපිළිවෙලක් සැකසුවේ ඒ අනුවය.

අස්වැසුම ප්‍රතිලාභ හිමි නොවන සමෘද්ධිලාභීන්ට තවදුරටත් මුදල් ගෙවීම මෙහි එක් යෝජනාවකි. එසේම අස්වැසුම ප්‍රතිලාභීන්ට ජූලි සහ අගෝස්තු දීමනාවද එලෙසම ගෙවීමටත් හැකි ඉක්මණින් අභියාචනා හා විරෝධතා අවසන් කිරීමටත් එහිදී තීන්දු කෙරිනි. ඊට අදාළ කැබිනට් පත්‍රිකාව මුදල් ඇමති ලෙස ජනපති රනිල් ඇමති මණ්ඩලය වෙත ඉදිරිපත් කළ අතර ඊට අනුමැතිය හිමිවිනි.

ඇමති මණ්ඩල හමුවේදි නියගය හා සමනල වැව විදුලි ගැටළුව ගැන ද සාකච්ඡාවට ඇදී ආවේය. විදුලිබල ඇමති කාංචන විදුලියට අදාළ ගැටළුව ඉදිරිපත් කළ අතර කෘෂි ඇමති මහින්ද අමරවීර ගොවි ගැටළුව ඉදිරිපත් කළේය. පසුව ගොවීන්ට වෙනත් විකල්පයක් සොයා දීමට හා විදුලිය වෙනුවෙන් සමනල වැව ජලය ඉතිරි කර ගැනීමට ඇමති මණ්ඩලය තීන්දු කෙරිනි.

ඊට අමතරව දකුණු පළාත රටේ ප්‍රධාන සම්ප්‍රේෂණ ධාරාවට සම්බන්ධ නොවීම ගැන සොයා බලන ලෙස ද ජනපති රනිල් උපදෙස් දුන්නේ සාගල රත්නායකට හා ඇමති කාංචනටය. ඔවුන් මේ ගැන සොයා බැලීමේදි හෙළිදරව් වූවේ එක් තේ වත්තක් මැදින් සම්ප්‍රේෂන රැහැන් ඇදීමට එහි හිමිකරු විටින් විට කොන්දේසි ඉදිරිපත් කිරීම හා ඒවා වෙනස් කිරීම ගැටළුවට හේතුව බවය. මේ බව ජනපති දැනුම්වත් කිරීමෙන් පසු ඔහු කීවේ කමිටුවක් පත් කොට හැකි ඉක්මණින් ප්‍රශ්නය විසඳන ලෙසය.

අඟහරුවාදා පොහොය දිනය යෙදී තිබුණු බැවින් එදින විවේකයක් ගන්නා බව කාර්ය මණ්ඩලයට දැනුම් දුන් ජනපති රනිල් ජපන් දූත පිරිස ගැන සොයා බැලීමේ වගකීම කාර්ය මණ්ඩල ප්‍රධානි සාගල රත්නායකට පැවරුවේය.

### ජපන් අතහිත

අදාළ දූත පිරිස කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර ද මුණ ගැසී තිබුණු අතර ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී සාගල ද ඊට එක්ව සිටියේය. මෙහිදි ජපන් රැකියා ගැනද සාකච්ඡා වූ අතර ඇමති මනූෂ ඉල්ලා සිටියේ ත්‍රිවිධ හමුදාවෙන් විශ්‍රාම ගන්නා කණ්ඩායම් වෙනුවෙන් අවශ්‍ය පුහුණුව හා ප්‍රමුඛතාවය ඊට ලබා දෙන ලෙසය.

ඒ වෙනුවෙන් විශේෂ පුහුණු මධ්‍යස්ථානයක් මෙරට පිහිටුවීම ගැන ද ඔවුන් කතා බහ කළෝය. ජපන් රජයේ ප්‍රධානීන් මෙලෙස ජනපති ඇතුළු ඇමතිවරුන් මුණ ගැසෙද්දී එක්සත් ජාතික පක්ෂ මහලේකම් පාලිත රංගේ බණ්ඩාර මුණ ගැසුණේ ජපන් විදේශ ඇමති සමඟ පැමිණි ආසියා පැසිපික් කලාපයේ අධ්‍යක්ෂ අයිවස් කිචරෝය.

මෙරට ආර්ථිකය නගා සිටුවීම වෙනුවෙන් යෝජනා 4ක් මහලේකම්වරයා විසින් ජපන් අධ්‍යක්ෂවරයා වෙත යොමු කළේ මේ හමුවේදීය. ඉංග්‍රිසි භාෂාවෙන් ආරම්භ වූ මෙම කතා බහ අවසන් වූවේ ජපන් හා සිංහල භාෂාවන් ගෙනි. ඒ ඔවුන් දෙදෙනා සමුගනිද්දි මහලේකම් රංගේ ජපන් භාෂාවෙන් ඔහුට සුබ පතද්දී, ජපන් අධ්‍යක්ෂවරයා සිංහලෙන් සුබ පැතීමත් සමඟය. මහලේකම් මේ ගැන විමසද්දී ඔහුට දැන ගැනීමට ලැබුණේ අයිවස් කිචරෝ පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් සිංහල භාෂාව ඉගෙන ගෙන ඇති බවය.

මහලේකම්ට ජපන් භාෂාව ඉගෙනීමට ආරාධනා කරමින් අධ්‍යක්ෂ අයිවස් කිඩරෝ සමුගත්තේ ලේකම් රංගේ ඉදිරිපත් කළ යෝජනා ජපන් රජයට භාරදෙන බව කියමිනි.

ඇමති මනූෂ හා කාර්ය මණ්ඩල ප්‍රධානි සාගල ජපානයේ සිට මෙරටට පැමිණ සිටින රාජ්‍ය ඇමති ෆුජිමාරෝ ඇතුළු දූත පිරිසට රාත්‍රී භෝජන සංග්‍රහයක් සංවිධානය කළේ කොළඹ අවන්හලකදීය. ජනපති උපදෙස් මත සංවිධානය වූ මෙම රාත්‍රී භෝජනය සංග්‍රහය රසවත් එකක් වූවේ සිංහල හා ජපන් ගීතවලින් සවන් පිරී ඉතිරි යාම නිසාවෙනි.

ඇමති මනූෂ තබ්ලා ගසද්දී ෆුජුමාරු ඇමති ඇතුළු පිරිස ගීත ගයන්නට වූහ. අවසානගේ ගී ගයමින් නටමින් මොවුන් විනෝද වූවේ ශ්‍රී ලාංකීය ආගන්තුක සත්කාරය අගය කරමිනි.

ජනපති රනිල් බදාදා පෙරවරුවේ සෞඛ්‍ය ඇමති කෙහෙළිය ඇතුළු සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රධානීන් මුණ ගැසුණේ පවතින සෞඛ්‍ය අර්බුදය ගැන කතා කිරීමටය. ජනපති රනිල් මුලින්ම ඔවුන්ට කීවේ සෞඛ්‍ය ආඥා පනත වෙනස් කරන ලෙසයි. ඉංග්‍රීසින් ගෙනා සෞඛ්‍ය ආඥා පනත දැන් යල් පැන ගිය එකක් බැවින් නව පනතක් මාස 6ක් තුළ සකස් කරන්නැයි ජනපති රනිල් නිලධාරීන්ට උපදෙස් දුන්නේය. එසේම සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ගැටළු විසඳීම වෙනුවෙන් රුපියල් බිලියන 30ක් වෙන් කිරීමට ද ඔහු එහිදී පියවර ගත්තේය.

### මහ සමුළුවකට ලකලෑස්තිය

එදින සවස පැවැති එක්සත් ජාතික පක්ෂ කෘත්‍යාධිකාරි මණ්ඩල රැස්වීමට ජනපති එක්වූවේ පක්ෂ නායකයා ලෙසටය. පක්ෂ ව්‍යවස්ථාව අනුව නායකයා නොමැතිව කෘත්‍යාධිකාරි මණ්ඩලය රැස්විය නොහැකිය. පක්ෂ නායකයා පැමිණීමට ප්‍රථම කෘත්‍යාධිකාරි මණ්ඩල සභිකයන් සිරිකොත පක්ෂ මූලස්ථානය වෙත කෙමෙන් කමෙන් පැමිණෙන්නට වූහ.

කෘත්‍යාධිකාරි මණ්ඩල සභිකයන් නොවුන ද ඇමති හරීන් ප්‍රනාන්දු හා මනූෂ නානායක්කාර ද සිරිකොතට පැමිණෙනු එහි සිටියවුන්ට දැක ගන්නට හැකිවූනි. ඔවුන් මේ ගැන කසුකුසු නගද්දී ඔවුන් දෙපළ ගියේ පක්ෂයේ ජාතික සංවිධායක සාගල රත්නායකගේ නිල කාමරයටය.

ඔවුන් දෙපළ නිල කාමරයට ඇතුළු වෙද්දී "අපේ ආරාධනාව පිළිගෙන පැමිණීම ගැන සතුටුයි." සාගල කීවේ ඔවුන් දෙපළ පිළිගනිමිනි. "මේක අපේ මහගෙදරනේ." දෙදෙනා පිළිතුරු බැන්දේ එකටය.

නායකයා පැමිණ කෘතයාධිකාරි මණ්ඩලය ආරම්භ වන තෙක් ඔවුන් එහි රැඳෙමින් රටේ ප්‍රශ්න කතා බහ කරන්නට වූහ. කෘත්‍යාධිකාරි මණ්ඩල සභිකයන්ගෙන් නව දෙනෙකු හැර සෙසු සියල්ලෝම ඊට සපැමිණ සිටියහ. මෙම නව දෙනා මෙයට සහභාගී නොවන බව කල් තියා දැනුම් දී තිබුණේ විවිධ හේතු ඉදිරිපත් කරමිනි.

කෘත්‍යාධිකාරි මණ්ඩල රැස්වීම ආරම්භයේදීම පක්ෂ නායක ජනපති රනිල් විසින් ඇමති හරීන් හා මනූෂ දෙපළ පිළිගනිමින් සමාව අයදීමට යටත්ව ඔවුන් නැවත කෘත්‍යාධිකාරි මණ්ඩලයට එක් කරගන්නා බව කීවේ කාගෙත් සිනා මැදය.

පක්ෂ මහලේකම් සම්මේලන දිනයට අනුමැතිය ගැනීමෙන් පසු 77 වැනි සංවත්සර සම්මේලනය පැවැත්වීමට අදාළව 14 දෙනෙකුගෙන් සමන්විත සංවිධාන කමිටුවක් පත් කිරීමට අනුමැතිය ලබා ගත්තේය.

අනතුරුව එක්සත් ජාතික පක්ෂ කෘත්‍යාධිකාරි මණ්ඩල සභිකයන් අමතමින් පක්ෂ නායක ජනපති රනිල් ඩී.එස්. සේනානායක ශ්‍රීමතාණන්ගේ සිට වත්මන් පක්ෂ නායකයා දක්වා කාලය තුළ වූ දෑ ගෙන හැර පාමින් පක්ෂය ගමන් කළ යුතු ආකාරය ගැන දීර්ඝ පැහැදිලි කිරීමක් කළේය. එකමුතුවකින් තොරව පක්ෂය කල්ලි කණ්ඩායම් වශයෙන් බෙදීම නිසා ඇතිවූ විනාශයන් ගැන ද පැහැදිලි කළ ජනපති රනිල් ඉදිරියට පක්ෂය සාමුහික ගමණක් යාම ගැන කරුණු දැක්වූවේ අනාගතය ගැනද කියා පාමිනි.

බ්‍රහස්පතින්දා සුපුරුදු පරිදි ජනපති මුදල් අමාත්‍යාංශය වෙත පැමිණියේ සතියේ ආර්ථික සමාලෝචනය වෙනුවෙනි. මුදල් අමාත්‍යාංශය වෙත සුපුරුදු පරිදි මැති ඇමතිවරු පිරිසක් ද පැමිණ සිටියේ ජනපති හා කතා බස් කිරීමටය.

ජල ගාස්තු සංශෝධනය ගැන මෙන්ම ජාතික ගීය වෙනස් කිරීම ගැන ද මෙහිදි සාකච්ඡා වූහ. ජල ගාස්තු වැඩිවීම කෙටිකාලීන තත්ත්වයක් බවත් පසුව මෙය වෙනස් වනු ඇති බවත් එහිදී කරුණු හෙළිදරව් වූවේය. අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය ගැන මෙන්ම 13 වැනි සංශෝධනය ගැන ද මෙහිදි කතා වූවේය.

Mediaman



# රාජතාන්ත්‍රික මැන්ඩේට් එකේ අප්ඩේට් එක කොහොමද?

**"ජනාධිපති රනිල් වික්‍රමසිංහට මැන්ඩේට් එකක් නෑ. ඒ නිසා ජාත්‍යන්තරයේ කිසිම පිළිගැනීමක් නෑ. කවුරුත් සුබ පැතුවෙත් නෑ. සාමාන්‍යයෙන් ලංකාවේ ජනාධිපතිවරයෙක් පත්වුණාට පස්සේ පළමුවෙන් ඉන්දියාවේ නිල සංචාරයක් සඳහා ආරාධනා කරනවා, මේ පාර ඒකත් නෑ. ජාත්‍යන්තරේ පිළිගත් නායකයා කිව්වට දැන් ඒ මොකුත් නෑ."**

මේ ජනාධිපති රනිල් වික්‍රමසිංහ ජනාධිපති වූ පසුව මේ රටේ බංකොලොත් විපක්ෂය කියපු කතාය. නමුත් ඒ කිසිවකටවත් ජනාධිපතිවරයා පිළිතුරු දෙන්න ගියේ නැත. ඒ වෙනුවට ඔහු මුළුමනින්ම අවධානය දී සිටියේ වැටුණු රට ගොඩගැනීම කෙරෙහිය. ඔය අතරේ 2022 සැප්තැම්බරයේ ජනාධිපති රනිල් ලෝකයේම අවධානය දිනාගත් අවමංගල්‍ය උත්සව 2ක් සඳහා සහභාගී විය. එකක් බ්‍රිතාන්‍ය රැජිණ වූ දිවංගත දෙවැනි එළිසබෙත්ගේ ය. ඊට සතියකට පසුව සහභාගී වූ අනෙක ඝාතනයට ලක් වූ ජපානයේ හිටපු අගමැති ශින්සෝ අබේගේ අවමංගල්‍ය උත්සවය ය. මෙහිදීද විපක්ෂය කෝචෝක් දැමුවේ, **"මැන්ඩේට් එකක් නොමැති ජනපති කරන්නේ ලොව පුරා අවමංගල්‍ය උත්සව සඳහා සහභාගීවීම පමණයි"** කියමින්ය.

එහෙත් ජනපති රනිල් මේ යන එන ගමන් කරන්නේ මොකක්ද කියා තේරුම් ගන්න හැකියාවක් විපක්ෂයට තිබුණේ නැත. ජනපතිගේ මැන්ඩේට් එක ප්‍රශ්න කළ විපක්ෂයට තරු පැන්නේ පසුගිය ජූලි මාසයේය. එනම් ජනපති පදවි ප්‍රාප්තියට වසරක් පිරෙන තැනය. ඒ වෙනුවෙන් ලද පළමු ත්‍යාගය වූයේ ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදීගේ නිල ආරාධනයක් අනුව ජූලි 20 සිදු කළ ඉන්දීය නිල සංචාරයය.

එහිදී අගමැති මෝදී සමඟ වූ සුවිශේෂ භෝජන සංග්‍රහය කාගේත් අවධානය දිනාගෙන තිබූ අතර ඒ, ඊට පෙර එවන් බුහුමනක් ලබාදී තිබුණේ ප්‍රංශ ජනාධිපති වෙත පමණක්වීම නිසාය. නායකයන් අතර පැවති සාකච්ඡාවලින් අනතුරුව රාජ්‍ය නායකයින් දෙදෙනා සහභාගී වූ ඒකාබද්ධ ප්‍රවෘත්ති සාකච්ඡාවකට එක්වෙමින් අගමැති මෝදී කියා සිටියේ ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර මඟී පාලමක් සහ තෙල් නල මාර්ගයක් ඉදිකිරීම සම්බන්ධයෙන් වන ශක්‍යතා පිළිබඳ කටයුතු කරන බවය.

ඉන්දීය ප්‍රතිපත්ති තුළ ශ්‍රී ලංකාව සෑම විටම වැදගත් ස්ථානයක පසුවන බවත් ඉන්දියාවේ **"අසල්වැසියා ප්‍රථමයෙන්"** යන ප්‍රතිපත්තිය සහ **"සාගර්"** දැක්ම යන දෙකෙහිම ශ්‍රී ලංකාව ද වැදගත් ස්ථානයක් ගන්නා බවත් සඳහන් කළේය. එසේම ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ ආරක්ෂක අවශ්‍යතා සහ සංවර්ධනය එකිනෙකට බැඳී පවතින බවට විශ්වාස කරන බව ද අග්‍රාමාත්‍ය මෝදී මෙහිදී ප්‍රකාශ කළේය.

එසේම සමුද්‍රීය, ගුවන්, බලශක්ති සහ විදුලිබල, වෙළෙඳ ආර්ථික සහ මූල්‍ය කටයුතු, පුද්ගල සබඳතා යන ක්ෂේත්‍ර 05ක් ඔස්සේ දෙරට අතර සබඳතා වර්ධනය කර ගැනීමට අවධානය යොමු වූ ඒකාබද්ධ ප්‍රකාශනයක් ද එළිදැක්විණ.

පදවි ප්‍රාප්තියට වසරක් පිරෙන තැන මැන්ඩේට් එකක් නැති නිසා ඉන්දියාව ජනපති රනිල්ව නොතකා ඇති බවට විපක්ෂය කී කතා පුස්සක්ව ගියේ එහෙමය. මේ හරහා ජනපති උදාකර ගත්තේ ලොව නැගී එන විශාලතම ආර්ථික කලාපයක් වන ඉන්දියානු සාගර කලාපය තුළ ඇති සංවර්ධන අවකාශයන්ගෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමේ අවස්ථාවය. කවුරුන් කොහොම පම්පෝරි ගැහුවත් වත්මන් ගෝලීය හැඩගැස්ම තුළ ලෝකයේ කිසිඳු රටකට තනිව ගමනක් නැත. එවැන්නක් ගැන සිතීමත් මුග්ධකමක්ය. ඒ ලොව දියුණු සෑම රටක්ම එම ප්‍රගතිය උදාකරගෙන ඇත්තේ කලාප හවුල්කාරිත්වය තුළින් වන නිසාය. ඒ අනුව දෙපාර්ශ්වයටම ප්‍රතිලාභ ලැබෙන අයුරින් සහ තර්ජනයක් නොවන අයුරින් ඉන්දු - ලංකා සබඳතා වර්ධනය කර ගනිමින් ශ්‍රී ලංකාවේ සංවර්ධන අපේක්ෂා ඉටුකර ගැනීම ජනාධිපතිවරයාගේ වැඩපිළිවෙළ බව පැහැදිළිය.

ඉන්දීය සංචාරය නිමාකර ලංකාවට පැමිණි ජනාධිපතිවරයා මුණගැසුණේ චීන කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරක සභා දේශපාලන මණ්ඩල සභික සහ චොන්ග්කින්ග් නාගරික කමිටුවේ ලේකම් යුවාන් ජියාජුන් ඇතුළු චීන නියෝජිත පිරිස ය. ශ්‍රී ලංකාවේ ඉදිරි සංවර්ධන සැලසුම් පිළිබඳ මෙහිදී ජනාධිපතිවරයා යුවාන් ජියාජුන් ප්‍රමුඛ චීන නියෝජිත පිරිස දැනුවත් කළ අතර රට තුළ පවතින නව වෙළෙඳ සහ ආයෝජන අවස්ථා පිළිබඳව ද පැහැදිලි කළේය.

එසේම මෙම කටයුතුවලදී කලාපීය සහයෝගීතාව වර්ධනය කර ගැනීමේ වැදගත්කම පිළිබඳව ද සාකච්ඡාවට ලක් විය. ශ්‍රී ලංකාවේ ණය ප්‍රශස්තකරණ වැඩසටහනෙහි ප්‍රගතිය මෙන්ම රජය ක්‍රියාවට නංවා ඇති ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙළ පිළිබඳව ද ජනාධිපති රනිල් වික්‍රමසිංහ එහිදී අදහස් දැක්වීය. එම කටයුතු අවසන් වීමෙන් පසු, නවතා දමා ඇති සංවර්ධන ව්‍යාපෘති කඩිනමින් යළි ආරම්භ කර ජාතික ආර්ථික සංවර්ධනයට ශක්තිමත් ලෙස දායක කරගත හැකි වනු ඇති බවට ද ජනාධිපතිවරයා විශ්වාසය පළ කළේය.

ඉදිරි දශක දෙක, තුන තුළ ලෝකයේ සිදුවන ආර්ථික වර්ධනයෙන් තුනෙන් දෙකක් පමණ සිදු වන්නේ ආසියානු පැසිෆික් කලාපය තුළ වන අතර නායකත්වය ගනු ලබන්නේ ඉන්දියාව සහ චීනය බව අමුතුවෙන් කිවයුතු නැත. ඒ අනුව එක් පසෙකින් ඉන්දු - ශ්‍රී ලංකා සබඳතා පුළුල් කරගන්නා අතරේ කිසිම ගැටලුවකින් තොරව චීනය සමගද සබඳතා ශක්තිමත් කරන බව මේ හරහා තහවුරු වන්නේය.

ජූලි 22 සිදුවූ මෙම හමුවෙන් අනතුරුව තවත් ඓතිහාසික රාජතාන්ත්‍රික පැමිණීමක් සිදුවිය. ඒ ප්‍රංශ ජනාධිපතිවරයෙක් මෙරට සංචාරයක නිරත වූ පළමු අවස්ථාව සනිටුහන් කරමින් ජූලි 28 වනදා ප්‍රංශ ජනාධිපති එමානුවෙල් මැක්‍රොන් සිය දකුණු පැසිෆික් කලාපයේ සංචාරයෙන් අනතුරුව මෙරටට පැමිණීමය. ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රකෘතිය සඳහා සහාය දැක්වීමට ප්‍රංශයේ කැපවීම එහිදී ප්‍රංශ ජනාධිපතිවරයා යළි සහතික කළ අතර ණය ප්‍රශස්කරණ වැඩපිළිවෙළේ දී ශ්‍රී ලංකාවට ප්‍රංශයේ සහාය අඛණ්ඩව හිමිවීමද සහතික කෙරිණ. එපමණක් නොව දෙරට අතර ද්විපාර්ශ්වික සබඳතා නව ක්ෂේත්‍ර රැසක් ඔස්සේ ශක්තිමත් කර ගැනීම පිළිබඳ වැඩ නායක දෙපළ සාකච්ඡා පැවැත්වූහ.

එහිදී ප්‍රංශය සාමාජිකත්වය දරණ ඉන්දීය සාගර කලාපීය සංගමයේ (IORA) ඉදිරි සභාපතිත්වය අතරතුර ශ්‍රී ලංකාව සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට ප්‍රංශය දැඩි උනන්දුවෙන් පසුවන බවද ප්‍රංශ ජනාධිපතිවරයා පැවසූ අතර ප්‍රංශය ක්‍රියාකාරීව සහභාගී වන ඉන්දීය සාගර කොමිසම කෙරෙහි ජනාධිපති රනිල් වික්‍රමසිංහගේ කැපවීම ද මෙහිදී ප්‍රකාශ කෙරිණ. 2023 ජුනි 22 සිට 23 දක්වා ජනාධිපති මැක්‍රොන් විසින් පැරිස් නුවරදී සංවිධානය කළ නව ගෝලීය මූල්‍ය ගිවිසුමක් සඳහා වන සමුළුව ඉතා කාලෝචිත බව ඊට සහභාගී වුවෙකු වශයෙන් අගය කරන බව එහිදී සඳහන් කළ ජනාධිපති රනිල් වික්‍රමසිංහ තිරසාර අනාගතයක් සඳහා වන ගෝලීය ප්‍රයත්නයන් සඳහා ශ්‍රී ලංකාවේ කැපවීම අවධාරණය කරමින් පැරිස් න්‍යාය පත්‍රයට සම්බන්ධ වීමට ශ්‍රී ලංකාවේ එකඟතාව ද ප්‍රකාශ කෙරිණ.

මෙම සාකච්ඡාවලින් අනතුරුව ප්‍රංශ ජනාධිපති එමානුවෙල් මැක්‍රොන් ට්විටර් පණිවුඩයක් නිකුත් කරමින්, **"ශ්‍රී ලංකාව සහ ප්‍රංශය ඉන්දියන් සාගරයේ එකම අරමුණක් වන විවෘත, විස්තීර්ණ සහ සමෘද්ධිමත් ඉන්දු- පැසිෆික් කලාපයක් බෙදා ගන්නා රටවල් දෙකකි. කොළඹදී අපි එය තහවුරු කළා. අපගේ 75 වසරක රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ශක්තිමත්ව, අපගේ හවුල්කාරිත්වයට නව යුගයක් විවෘත කරන්නෙමු"** යනුවෙන් සඳහන් කර තිබුණි. ප්‍රංශය වැනි ධනවත් මෙන්ම බලවත් රටක පළමු පුරවැසියෙක් මේ ආකාරයට රටකට ආවාට ගියාට එන්නේ නැත. ඒ පැමිණීම සිදුවූයේම ඔවුන්ට ජනාධිපති රනිල් වික්‍රමසිංහ සම්බන්ධව ඉහළ රාජතාන්ත්‍රික ඇගයීමක් තිබූ නිසාය.



මෙම හමුවට පසුදින එනම් ජූලි 29 වනදා දෙදින නිල සංචාරයක් සඳහා මෙරටට පැමිණියේ ජපාන විදේශ අමාත්‍ය හයාෂි යොෂිමාසා ඇතුළු දූත කණ්ඩායමක් ය. ජපානය වැනි රටක විදේශ අමාත්‍යවරයෙක් යනු රාජතාන්ත්‍රික වශයෙන් කෙතරම් වැදගත්ද යන්න සහ ඔවුන්ට මෙරට සම්බන්ධව ඇතිවී තිබෙන තහවුරුව මේ හරහා තහවුරු වන බව අමුතුවෙන් කිවයුතු නැත. ජපාන සහය ඇතිව මෙරට ආරම්භ කෙරුණු සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය අත්හිටුවීමට පසුගිය ගෝඨාභය පාලනය කටයුතු කිරීමත් සමඟ ජපානය මෙරට ක්‍රියාත්මක කර තිබූ සියලු සංවර්ධන කටයුතු අත්හිටුවනු ලැබිණ. නැවත වැරදීමකින්වත් මේ රට දෙස බලන තැනක ජපානය හිටියේ නැත.

එවැනි පසුබිමක ජපාන විදේශ අමාත්‍යවරයා ප්‍රමුඛ දූත කණ්ඩායමේ මේ ශ්‍රී ලංකා සංචාරය සැබවින්ම ජනාධිපති රනිල් වික්‍රමසිංහගේ විදේශ ප්‍රතිපත්තිය නිසාය. රාජතාන්ත්‍රික විෂයෙහි ඔහු සතු පරිණත හැසිරීම යළි යළිත් තහවුරු කිරීමක්ය. ඒ අනුව ජපානය සහ ශ්‍රී ලංකාව අතර පවතින දීර්ඝ කාලීන ද්විපාර්ශ්වික සබඳතාවන් සිහිපත් කරමින් ඇරඹි මෙම සාකච්ඡාවේ දී ක්ෂේත්‍ර රැසක් ඔස්සේ එම සබඳතා තවදුරටත් ශක්තිමත් කර ගැනීම සඳහා දෙපාර්ශ්වයම කැපවීමෙන් යුතුව කටයුතු කිරීමේ අවශ්‍යතාව අවධාරණය කෙරිණි. ශ්‍රී ලංකාවේ ණය ප්‍රශස්තකරණ ක්‍රියාවලිය සඳහා ජපාන රජය ලබා දෙන සහාය පිළිබඳ මෙහිදී සිය කෘතඥතාව පළ කළ ජනාධිපති රනිල් වික්‍රමසිංහ ණය ප්‍රශස්තකරණ ක්‍රියාවලියේ පොදු වේදිකාව වැඩිදියුණු කිරීම සහ එම ක්‍රියාවලිය වේගවත් කිරීම වෙනුවෙන් ප්‍රංශ ජනාධිපති එමානුවෙල් මැක්‍රොන් සමග සිදු කළ සාකච්ඡාව පිළිබඳව ද කරුණු පැහැදිළි කළේය.

එසේම ජපාන - ශ්‍රී ලංකා සහයෝගීතාව තවදුරටත් විදාහ දැක්වෙන සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය (LRT), වරාය නැගෙනහිර පර්යන්තය, මහනුවර සංවර්ධන සැලැස්ම, මධ්‍යම අධිවේගී මාර්ගය සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ පුළුල් කිරීම යන ව්‍යාපෘති කඩිනම් කිරීමේ වැදගත්කම ද මෙම සාකච්ඡාවේ දී අවධානයට ලක් විය. ඒ අනුව රනිල් වික්‍රමසිංහගේ ජනාධිපති පදවි ප්‍රාප්තියට වසරක් පිරුණු ජූලි මාසයේ ලොව බලවත්ම නායකයන් වන මෙන්ම ශ්‍රී ලංකාවට තීරණාත්මකව වැදගත් වන නායකයන් රැසක් දින දහයක් තුළ හමුවී නිල සාකච්ඡා පැවැත්වීම කොහෙත්ම සුළුකොට තැකිය හැකි කාරණයක් නොවේ.

මේ හැර 2022 වසරේ ජූලි 21 වැනිදා ජනාධිපති ධුරයට පත්වීමෙන් පසු ජනාධිපති රනිල් වික්‍රමසිංහ අවස්ථා හයක දී විදේශ සංචාරයන්වල නිරත විය. ජනාධිපති රනිල් වික්‍රමසිංහ පසුගිය වසරේ දී බ්‍රිතාන්‍යයේ දෙවන එලිසබෙත් මහ රැජිණගේ රාජකීය අවමංගල්‍ය සඳහා සහභාගීවීමට ද, පසුව තුන්වන චාර්ලස් රජුගේ පදවි ප්‍රාප්ති උත්සවයට ද ඇතුළුව අවස්ථා තුනක දී බ්‍රිතාන්‍යයේ සංචාරය කරනු ලැබුවේ ය. එසේම අවස්ථා දෙකක දී ජපානයේ නිල සංචාරවල ද නිරත විය. පිලිපීනයේ පැවති ආසියානු සංවර්ධන බැංකු අධිපතිවරුන්ගේ සැසිවාරය, ඊජිප්තුවේ පැවති 2022 එක්සත් ජාතීන්ගේ කාලගුණික විපර්යාස පිළිබඳ සමුළුව සහ ප්‍රංශයේ පැවති නව ගෝලීය මූල්‍ය ගිවිසුමක් සඳහා වන සමුළුවට ද ජනාධිපතිවරයා සහභාගී වූයේ ය. මීට අමතරව, සිංගප්පූරු අග්‍රාමාත්‍යවරයාගේ ආරාධනයෙන් ජනාධිපති වික්‍රමසිංහ එරට සංචාරයක නිරත වූයේ ඉකුත් මැයි මාසයේ දීය.

විපක්ෂය මොනවා කිව්වත් ජනපති රනිල් මේ සෑම සංචාරයක්ම සිදුකර සිටියේ 2048 බලගතු සංවර්ධිත රටක් ඇති කිරීමට අවශ්‍ය විදෙස් සම්බන්ධතා ජාලය ශක්තිමත් කර ගන්නටය. ඒ වෙනුවෙන් මුලික පදනම් සකස් කරගන්නටය.

ජපානය සමඟ ඒ වන විටත් මෙරට රාජතාන්ත්‍රික සබඳතා පැවතියේ බරපතළ පළුදුවීමකට ලක්ව ය. එම පළුදු වූ සම්බන්ධතා යළි සකස් කිරීමට අවස්ථාවක් මේ ඔස්සේ උදාකර ගන්නට ජනාධිපති රනිල් ක්‍රියා කළේය. එසේම එම ගමනේදී තවත් වැදගත් කාරණයක් සන්නිවේදනය කරන්නටද ජනාධිපති රනිල් කටයුතු කළේය. මේ මොහොතටද වලංගු ආසියානු කලාපය සම්බන්ධව ජපාන හිටපු අගමැති ශින්සෝ අබේගේ දැක්ම සහ වැඩපිළිවෙල ය.

ආසියා පැසිෆික් කලාපය තුළ ඇමරිකානු මිත්‍ර රටවල් සියල්ල එක් යෝධ නිදහස් වෙළඳ කලාපයකට ගෙන ඒම සඳහා වූ ජනාධිපති බරක් ඔබාමා ගොඩනැගූ සුවිසල් සැලැස්ම වූ ට්‍රාන්ස් පැසිෆික් හවුල්කාරිත්වයෙන් (TPP) 2016 දී, ඩොනල්ඩ් ට්‍රම්ප් ඉවත්වූ අවස්ථාවේ එහි නායකත්වය භාරගත්තේ අගමැති

07 පිටුවට

06 පිටුවෙන් ශින්සෝ අබේ ය. ඒ ට්‍රාන්ස් පැසිෆික් හවුල්කාරිත්වය සඳහා වූ විස්තීරණ සහ ප්‍රගතිශීලී ගිවිසුම හෙවත් CPTPP නිර්මාණය කරමින්ය. එසේම එක්සත් ජනපදය, ජපානය, ඉන්දියාව සහ ඕස්ට්‍රේලියාව අතර සන්ධානයක් වන Quad නිර්මාණය කිරීමේදී ද අබේ අගමැතිවරයා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය. අබේ අගමැතිගේ අභාවය ඉන්දියාව ප්‍රමුඛ ආසියානු කලාපයේ රටවල් රැසක් කම්පා කළේ ඒ නිසාය. විශේෂයෙන් අබේ සැළකෙන්නේම ජනප්‍රියවාදී නොවුණු නමුත් අවශ්‍ය දේ කළ අයෙකු ලෙසය. එකී අවමංගල්‍ය සඳහා සහභාගී වෙමින් ජනපති රනිල් ද සංකේතවත් කළේ, තමන්ද ලංකාවේ මෙතෙක් සිදු නොවුණු, ජනප්‍රිය නොවන නමුත් අනිවාර්යයෙන් සිදු කළ යුතු ප්‍රතිසංස්කරණ දියත් කිරීමට සූදානම් ජනාධිපති මෙන්ම ආසියාව සම්බන්ධව අබේගේ මැදිහත්වීම ගෞරවයෙන් යුතුව සළකන්නෙකු බවය. බාහිර බලපෑම්වලින් තොර බලගතු ආසියාවක් ගොඩනැගීමේ ප්‍රයත්නයට දායකවීම සඳහා තම සූදානමය.

එසේම ජනාධිපති රනිල් වික්‍රමසිංහ ලෝකයේම අවධානය යොමුකරගත් තවත් සිදුවීමක් නම්, **"චාල්ස් රජු, ලෝක දේශගුණ සමුළුවට සහභාගීවීම අනවශ්‍ය බවට බ්‍රිතාන්‍ය රජය දැනුම්දී තිබියදී, ඊට ප්‍රතිවිරුද්ධ මතයක් දරමින් අදාළ සමුළුවට චාල්ස් රජුගේ පැමිණීමේ වැදගත්කම අවධාරණය කිරීම"** ය. එසේම දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියට (UNFCCC) අයත් සාමාජික රටවල් අතර දේශගුණික විපර්යාස පිළිබඳ සාකච්ඡා මෙහෙයවීමේදී මෙම සමුළුව වැදගත් කාර්යභාරයක් ඉටු කරන අතර පොදුරාජ්‍ය මණ්ඩලයට ඊට සැළකිය යුතු දායකත්වයක් සැපයිය හැකි බවද ජනාධිපතිවරයා අවධාරණය කළේය. දේශගුණ විපර්යාස සඳහා බලවත් රටවල කැපවීමේ අවශ්‍යතාව තමන් සහභාගී වූ සමුළු වාර දෙකෙහිදීම දැඩිව අවධාරණය කිරීමද රනිල් වික්‍රමසිංහ ජනාධිපති දෙස ලෝක අවධානය යොමුවූ කරුණක් විය.

මේ ආකාරයට ආසියාවේ මෙන්ම ගෝලීය බල දේශපාලනය තුළද අවධානය යොමු නොකර බැරි තැනට ප්‍රබල වූ ජනාධිපති රනිල්ගේ විදෙස් ප්‍රතිපත්තියේ තවත් තීරණාත්මක කඩයිමක් වූයේ, පසුගිය ජූලි මාසයේ සිදු කළ සිංගප්පූරු සහ ජපාන සංචාරයන්ය. සිංගප්පූරුවේදී මෙතෙක් අත්සන් කර ගැනීමට නොහැකිවූ වෙළඳ ගිවිසුම් අත්සන් තැබීමේ තම සූදානම සමඟ ද්වීපාර්ශ්වීය සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීමට පියවර ගත්තේය.

අනතුරුව ජපාන සංචාරයේදී ගෝලීය භූ දේශපාලන හැසිරීම හමුවේ කලාපයේ භූමිකාව හැඩගැස්වීම සඳහා ආසියානු රාජ්‍යයන් හඬක් නැඟීමේ වැදගත්කම ජනාධිපති රනිල් වික්‍රමසිංහ අවධාරණය කළේය. ඒ ජපානයේ ටෝකියෝ නුවර පැවැත්වුණු **"ආසියාවේ අනාගතය පිළිබඳ 28 වන ජාත්‍යන්තර සමුළුව" (Nikkei Forum)** අමතා සිය විශේෂ දේශනය සිදු කරමිනි. ජනාධිපති රනිල් වික්‍රමසිංහ එහිදී අවධාරණය කළේ ආසියාවේ විවිධත්වය කලාපයේ ආර්ථික වර්ධනයට දායක වන සාධකයක් වන අතර එය සැළකිය යුතු ගෝලීය බලවේගයක් බවය. එසේම, ආසියා-පැසිෆික් කලාපය සහ ඉන්දියන් සාගරය අතර වෙනස පිළිබඳව පැහැදිළි කළ ජනාධිපතිවරයා ආසියා-පැසිෆික් කලාපය ව්‍යුහගත කලාපීය සංවිධානයක් වන අතර ඉන්දියන් සාගර කලාපය නැගී එන අවකාශයක් බව ද සඳහන් කළේය. 1955 බැන්ඩුං නුවර පැවති ආසියානු අප්‍රිකානු සමුළුවේදී සහ ඉන්දියන් සාගරය පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රකාශනය ඉන්දියන් සාගර කලාපය සාම කලාපයක් ලෙස නම් කර තිබෙන බව සඳහන් කළ ජනාධිපතිවරයා ඉන්දු පැසිෆික් කලාපයේ සබඳතා පෝෂණය කිරීමට ශ්‍රී ලංකාවේ කැපවීම යළි තහවුරු කර සිටියේය.

චීනය සමඟ ස්ථාවර සබඳතාවක් ගොඩනගා ගැනීම සඳහා ජපානයේ G7 සහයෝගීතා ප්‍රවේශයේ වැදගත්කම පිළිගත් ජනාධිපතිවරයා **"නිදහස් සහ විවෘත ඉන්දු පැසිෆික් කලාපයක්"** සඳහා ජපානයේ දැක්මට සහාය පළ කළ අතර කලාපයේ සාමය සහ සහයෝගීතාව පෝෂණය කිරීම සඳහා ආසියානු ජාතීන් අතර විවෘත සංවාදයක් ද ඉල්ලා සිටියේය. තවද ඉන්දු-පැසිෆික් කලාපයේ බහු ස්ථර සම්බන්ධතාවයක් සඳහා ශ්‍රී ලංකාව කැපවී සිටින බවත්, අග්‍රාමාත්‍ය ෆුමියෝ කිෂිඩාගේ **"සාමය සඳහා වූ මූලධර්ම සහ සෞභාග්‍යය සඳහා වූ නීති"** ප්‍රතිපත්තියට ජනාධිපතිවරයා පූර්ණ සහය පළ කරන බවත් ජනාධිපති වික්‍රමසිංහ එහිදී පැවසීය. සෞභාග්‍යය සඳහා වන රීතිවලට අනුකූලව, ශ්‍රී ලංකාව ආර්ථික ලිහිල්කරණයේ ඉහළ මට්ටමක් සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් කලාපීය විස්තීරණ ආර්ථික හවුල්කාරිත්ව ගිවිසුම (RCEP) හි සාමාජිකත්වය සඳහා ඉල්ලුම් කරන බවද සඳහන් කළේය. චීනය සමඟ ස්ථාවර සහ ඵලදායී සබඳතාවක් ගොඩනඟා ගැනීමට ගෙන ඇති G7 ස්ථාවරය ශ්‍රී ලංකාව පිළිගන්නා බව පැවසූ ජනාධිපතිවරයා, එයට ශ්‍රී ලංකාවේ පූර්ණ සහයෝගය ලබාදීමට සූදානම් බවත්, එය සාමකාමී වාතාවරණයක් උදාකර ගැනීමට ඉවහල් වන බව ද ප්‍රකාශ කළේය.

අනතුරුව ජපාන අග්‍රාමාත්‍යවරයා හමුවූ ජනාධිපතිවරයා ජපාන රජයේ සහය මත ක්‍රියාත්මක කෙරෙමින් තිබූ කොළඹ සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය අතරමග නවතා දැමීම පිළිබඳ ජපාන රජය වෙත සිය කණගාටුව පළ කළේය. අදාළ ව්‍යාපෘතිය නැවත ඇරඹීම සඳහා ජපානයේ එකඟතාව පළවුණේ එහිදීය. එම සංචාරයේදී ජපාන මුදල් අමාත්‍ය ෂුනිචි සුසුකි, ජපානයේ හිටපු අග්‍රාමාත්‍ය යසුඕ ෆුකුඩා, ජපානයේ හිටපු අග්‍රාමාත්‍ය ටාරෝ අසෝ සමඟ ද සාකච්ඡා පැවැත්වීය. තවද එම සංචාරයේදී ම සිංගප්පූරු නියෝජ්‍ය අග්‍රාමාත්‍ය ලෝරන්ස් වොන්ග් සමඟද සාකච්ඡා පැවැත්වූ ජනාධිපති රනිල් වික්‍රමසිංහ සිංගප්පූරු නිදහස් වෙළෙඳ ගිවිසුම ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකාවේ කැපවීම යළි තහවුරු කර සිටියේය.

ජනාධිපති රනිල් වික්‍රමසිංහ තමන් කවුද මොනවද කරන්න යන්නේ යන්න ගෝලීය ප්‍රජාව හමුවේ තැබූ තවත් විශේෂ අවස්ථාවක් වන්නේ ජාත්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදී සංගමයේ (IDU) 40 වන සංවත්සරයට සමගාමීව ලන්ඩන් නුවර පැවති එහි වාර්ෂික සංසදය අවස්ථාවේ දීය. එහිදී කැනඩාවේ හිටපු අග්‍රාමාත්‍ය ස්ටීවන් හාපර් සමඟ පැවති සම්මුඛ සාකච්ඡාවේ දී ජනපති රනිල් මෙසේ අදහස් දැක්වීය.

**"මූලික වශයෙන්, අපි ගෝලීය දකුණේ සහ ආසියාවේ ස්ථාවරය සමඟ සිටිනවා. එක්සත් ජනපදය හා චීනය යන ලෝක බලවතුන් දෙදෙනාම අපට අවශ්‍යයි. ඉන්දු-පැසිෆික් කලාපය පිළිබඳ ආසියානු රටවල ඉදිරි දැක්ම යන කරුණ සැලකිල්ලට ගැනීමේදී පැසිෆික් සහ අනෙකුත් කරුණු අතිශයින්ම වැදගත්. චීනයේ නැගීම, කලාපයේ රටවල දියුණුව සඳහා ප්‍රධාන හේතුවක් වී තිබෙනවා. එබැවින් චීනයේ ආර්ථික සංවර්ධනය අපට ඉතා වැදගත්. ඉන්දියාව සහ ආසියානු කලාපීය රටවල්වල මෙන්ම මැදපෙරදිග අඛණ්ඩ තිරසාර වර්ධනයක් දැකීමට තවත් වසර 20 - 25ක් වත් ගතවනු ඇති. බහුපාර්ශ්වීය සබඳතා ශක්තිමත්ව ස්ථාපිත කරන අතර, පවත්නා ද්විපාර්ශ්වීය ශ්‍රී ලංකා එක්සත් ජනපද සබඳතා අගය කරනවා."**

ඒ සියලු අදහස් දැක්වීම් හරහා තහවුරු කෙරුණේ මෙරට සතු නොබැඳි විදෙස් ප්‍රතිපත්තිය ය. නැගී එන ආසියාවේ කුඩා නමුත් බලපෑම් සහගත රටක් ලෙස ශ්‍රී ලංකාව නැගී සිටීමේ සූදානම ය. ඒ වෙනුවෙන් මෙරට සතු ප්‍රතිපත්තිය සහ වැඩපිළිවෙලය. එහි කාටවත් ඇහිඳින්නට කළු ඇට තිබුණේ නැත. ගළවා උගුල්ලන්න වල් පැල තිබුණේ නැත. මේ ආකාරයට ජනාධිපති රනිල්ගේ විදේශ ප්‍රතිපත්තිය ලෝකයේම දේශපාලන අවධානය දිනාගන්නා පසුබිමේ, රටේ ආර්ථිකය යළි ගොඩගැනීම වෙනුවෙන් අනිවාර්යයක්ව තිබෙන ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියද සාර්ථක කරගන්න ඔහු සමත් විය. විදෙස් ණය හිමියන් තුළ විශ්වාසය තහවුරු කළා පමණක් නොව, පාර්ලිමේන්තුවේ අනුමැති ගෙන ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ වැඩසටහනකට එක්ව අනෙකුත් මූල්‍ය ආයතනවල විශ්වාසයද දිනාගත්තේය. ආයෝජක ආකර්ශනයට ද එය ඉවහල් වන බවද රහසක් නොවේය. මේ ආකාරයට ජනාධිපති රනිල්ගේ වෙහෙසේ ප්‍රතිඵල මේ මොහොතේ ලැබෙමින් ඇතුවා මෙන්ම ඉදිරියටත් ලැබීමට නියමිතය.

සැබවින්ම මෑත ඉතිහාසයේ මෙරට පාලකයකු වෙතින් මෙතරම් පුළුල් සහ නිරවුල් මෙන්ම ඉහළම රාජතාන්ත්‍රික හැසිරීමක් සහිතව ලෝකය ආමන්ත්‍රණය කර නොමැති බවට සැක සංකා නැත. එය එතරම්ම පැහැදිළිය. රටේ අනාගතය ද පැහැදිළි වන්නේ ඒ මග දිගේ ඉදිරියට ගියොත් පමණය.

**කුසල් ජයම්පති**

# ජල ගාස්තු වැඩිවීම රටට ප්‍රතිලාභයක්



ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් සම්බන්ධයෙන් ඇති ජාත්‍යන්තර නිර්ණායකයන් අනුව ශ්‍රී ලංකාව කියන්නෙ පිරිසිදු පානීය ජලය හිඟ රටකි. ඒ මන්දයත් නල මාර්ග හරහා බෙදාහැරෙන පිරිසිදු පානීය ජලය රටෙන් බහුතරයකට නොලැබෙන නිසාය. වර්තමාන මට්ටම අනුව නල ජලය ලැබෙන්නේ නිවාස හෝ ගොඩනැගිලිවලින් සියයට 40කට ආසන්න ප්‍රමාණයකටය. එම තත්වය පවා වර්ධනය කරගත්තේ මෑතකදී ය.

කොහොම නමුත් රජය විසින් පිරිසිදු පානිය ජලය බෙදාහැරීම වෙනුවෙන් දරණ පිරිවැය ජල පාරිභෝගිකයාගෙන් අය කෙරෙන බිල් පත්වලින් පිය වෙන්නේ නැත. එනම් රජය පාඩුවක් දරාගෙන එම ජලය බෙදාහැරීම කර තිබෙන බවය. මේ අනුව ජල ගාස්තු වැඩි කිරීම සම්බන්ධයෙන් වන කතා බහ කාලයක සිට පැවැතියේය. පසුගිය වසරේදී යම් සුළු ගාස්තු වැඩි කිරීමක් සිදු කළෙත් වසර 10කට පසුවය. නමුත් එම වැඩි කිරීම රජයේ පාඩු පියවීමට ප්‍රමාණවත් වූයේ නැත. ඒ අනුව ජලය වෙනුවෙන් නව සූත්‍රයක් නිර්මාණය කිරීමට කටයුතු කළ අතර ඒ අනුව පසුගිය 01 වෙනිදා සිට නව මිල ගණන් යටතේ ජලය බෙදාහැරීම සිදුවෙයි.

එම ජල ගාස්තු සංශෝධනය සකස් කිරීමේ දී මෙහෙයුම් පිරිවැය පමණක් පියවා ගැනීම සහ මෙහෙයුම් පිරිවැය හා ජාතික ජල සම්පාදන මණ්ඩලයේ ණය සේවාකරණය පියවා ගැනීම යන ක්‍රමවේද දෙක සැලකිල්ලට ගනිමින් සිදුකර ඇත. අමුතු ලාබයක් අපේක්ෂා කරද නැත.

මේ අනුව භාවිත කරන ඒකක ප්‍රමාණය අනුව මෙම සංශෝධනය මගින් ජල ගාස්තු වැඩි කර ඇත. උදාහරණයකට ගත හොත් ගෘහස්ථ ජල ගාස්තුව රු.20 සිට පළමු ඒකක 05 සඳහා නව ගාස්තු සංශෝධනයේදී ඒකකයකට රුපියල් 60කි. ඒකකයක් යනු ජල ලීටර් 1000ක ප්‍රමාණයකි. එනම් ගෙදර වහලයට උඩින් සවි කර ඇති ලීටර් දාහේ කළු තඩි ටැංකිය වරක් පුරවා දීමට මෙතුවක් කල් අයකර ඇත්තේ රු 20ක සොච්චම් මුදලකි. වෙළඳපොළෙහි ඇති ලීටර 1 වතුර බෝතලයක මිල සසඳා බැලුවිට රජය මේ පහසුකම සපයා දෙන්නේ කෙතරම් අඩු මිලකටදැයි වටහා ගත හැක.

මෙම ගාස්තු සංශෝධනයේදීත් සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ සහ වතු නිවාසවල ජල ගාස්තු ඉහළ යාමක් සිදුව නොකිරීමට රජය කටයුතු කර ඇත. අනෙකුත් සියලුම අංශ සඳහා ජල ගාස්තුව ඉහළ දමා ඇත.

කෙසේ නමුත් රජය බලාපොරොත්තු වූ පරිද්දෙන්ම ජල ගාස්තු වැඩිවීම ගැන විවිධ පාර්ශ්වයන්ගෙන් මේ වන විට විරෝධයන් ප්‍රකාශ වෙමින් තිබේ.

ජලය වෙළඳ භාණ්ඩයක් නොවේය, එයට නිෂ්පාදන වියදමක් නැත්තේය, ඒ නිසා හරි නම් ජලය නොමිලයේම ලබා දිය යුතු බවටත් මේ විරෝධතා පාඨ දකින්නට ලැබේ. මේ රටේ ජලය ස්වභාවිකවම නිෂ්පාදනය වන බව ඇත්තකි. නමුත් ජලාශවලින් ලබා ගන්නා ජලය, පානය සඳහා සුදුසු ලෙස සකස් කර නල මාර්ග හරහා බෙදාහැරීම වෙනුවෙන් රජයට පිරිවැයක් දරන්නට සිදුව තිබෙන බව අමතක කර මෙම විරෝධතා සංවිධානයවීම විකාරයකි.

කොහොම නමුත් නල ජලය පාවිච්චි කරන්නන් සියලුම ජල අවශ්‍යතාවයන් වෙනුවෙන් පාවිච්චි කරන්නේ ටැප් එක ඇරපු ගමන් එන පිරිසිදු කරන ලද පානීය ජලය ය. මේ නිසා ජල පාරිභෝජනය විශාලවීමෙහි බර ද රජයට දරන්න වී ඇත. ජලය නාස්ති කිරීමෙන් තොරව පාවිච්චි කිරීම ගැන කෙතරම් ප්‍රචාරක අධ්‍යාපනික වැඩපිළිවෙල ක්‍රියාත්මක වූවද ජලය නිකම් ලැබෙනවා කියන මානසිකත්වයෙන් ජනතාවට තවම ඇත්වීමට හැකියාව ලැබී නැත. මේ නිසා ජලය නිකරුනේ නාස්තිවෙන අංක එකේ සම්පතක් වී ඇත. සාමාන්‍යයෙන් පාරිභෝජනයට ගන්නා ජල ප්‍රමාණය විධිමත්ව අරපිරිමැස්මෙන් පාවිච්චි කරනවා නම් එම ප්‍රමාණය අඩකින්වත් අඩුකර ගැනීමේ හැකියාව ඇති බව ඇතැම් සමීක්ෂණ පෙන්වා දී ඇත.

මේ මොහොතේ ජල ගාස්තු වැඩිවීම ගැටළුවක් නම් කළ යුතුව ඇත්තේ ජලය අරපිරිමැස්මෙන් පාවිච්චි කිරීම මිසක පාරට බැස සහන ඉල්ලා සිටීම නොවේ. මන්ද රජයට එහෙම සහනදායක මිලක් දරාගෙන තවදුරටත් මේ රාජ්‍ය ආයතන නඩත්තුව සිදු කළ නොහැකි නිසාය. විදුලිය හා ඉන්ධන සම්බන්ධයෙනුත් රජය නිවැරදි ලෙස මිල නියම් කිරීමේ සූත්‍රයන් අනුව කටයුතු කිරීමට පියවර ගත්තේ රාජ්‍ය ආයතන පාඩුව තවදුරටත් රජයට දරා ගැනීමේ අසීරුතාවය මතය. රජය පාඩු පියවීම වෙනුවෙනුත් වැය කරන්නේ ජනතාවගෙන් අය කර ගන්නා බදු මුදල්මය. ජලය සම්බන්ධයෙන් ගතහොත් රටේ සියයට 40කගේ ජල පාරිභෝජනය වෙනුවෙන් සමස්ත ජනතාවගේම බදු මුදල් වැය කිරීම මෙතෙක් කල් සිදුව තිබේ. රාජ්‍ය බදු මුදල් වැය කළ යුතුව ඇත්තේ පොදු යහපත පිණිස වැඩි පුරවැසියන් ප්‍රමාණයකට සේවය කිරීම වෙනුවෙනි. ඒ අනුව මෙතෙක් කල් නල ජලය නොලැබුණ පිරිස් වෙත එම පහසුකම් සලසා දීම වෙනුවෙන් බදු මුදල් වැය කළ යුතුව ඇත. එසේම ඒ වෙනුවෙන් ජල සම්පාදන මණ්ඩලයට පාඩුදායක නොවන ආයතනයක් විය යුතුය. ආදායම්වලින් ලාභයක් එකතු විය යුතුය. එසේ සිදුවන්නේ නම් ජල ගාස්තු වැඩි කිරීමෙහි ප්‍රතිලාභයක් සමස්ත රටට ලැබීමට නියමිතය.

එපමණක් නොවේ, ජලය බෙදාහැරීම සම්බන්ධයෙන් රටේ පවතින රාජ්‍ය ඒකාධිකාරය වෙනුවට සහ එම සේවය වඩාත් කාර්යක්ෂම කිරීම වෙනුවෙන් පෞද්ගලික අංශය සම්බන්ධ කරගෙන මෙම පහසුකම් සංවර්ධනය කළ යුතුවීමත් විය යුතුව තිබෙන්නකි. ඒ සඳහා වන අවස්ථාවන් රජය සොයා බැලිය යුතුය.

**ප්‍රභාත් ජයසුමන**

# රනිල් කියන්නේ පුද්ගලයෙක් නෙමෙයි, ක්‍රමවේදයක්



රනිල් වික්‍රමසිංහ කළේ මොකක්ද? ඔහු සිතන්නේ කොහොමද? ඔහු මොනව කරන්නද හදන්නේ? මේ වැනි ප්‍රශ්න සාමාන්‍යයෙන් රනිල් සම්බන්ධයෙන් තිබේ. ඔහුව වටහා ගැනීම පහසු නැත. මේ නිසා රනිල් වික්‍රමසිංහගේ දේශපාලනය කුමක්ද කියා බොහෝ අයට තේරුමක් නැති බව පැහැදිලි කතාවකි. ඒ නිසාම නොමඟ යැවීම් නිතර වෙයි. සමහරවිට ඔහු වෙතින් නිශ්චිතවම දේවල් සම්පූර්ණයෙන් සරලව ප්‍රකාශ නොවන නිසා විය හැකිය. නමුත් රනිල්ගේ ප්‍රකාශ තරම් දිගක්, පළලක්, ගැඹුරක් ඇති ප්‍රකාශයන් මෙරට දේශපාලනඥයෙකු වෙතින් නම් මෑත කාලයේදී අසන්නට ලැබී නැත. එය වටහා ගැනීම වෙනම අධ්‍යයනයකි. දුෂ්කර අභ්‍යාසයකි. එහෙත් සියල්ල අවසානයේ ඔහු කළ කී දේ වඩාත් නිවැරදි බව වටහා ගත හැකිය.

රනිල් එජාපයට හිමි වූ එකම පාර්ලිමේන්තු අසුනේ වාඩිගත් දා (2021 ජුනි 23) ඔහු පාර්ලිමේන්තුව හමුවේ විශේෂ ප්‍රකාශයක් කරනු ලැබුවේය. ඒ සම්බන්ධයෙන් මෙම ලියුම්කරු අනෙක් තැනක (lankadaily.com) සටහන් කළේ,

**"...කොහොම වුණත් ඔහුගේ පැමිණීම ශ්‍රී ලාංකේය දේශපාලනයේ මොකක් හෝ බරපතල යමකට තුඩු දෙන්නක් විය හැකි බව ඒ බොහෝ දෙනා සැක මතු කර තිබිණි. රනිල්ගේ දේශපාලන භාවිතාව ගැන ඇති අතීත අත්දැකීම සහ ඔහු ඉදිරියේදී කරන්න යන්නේ කුමක්ද යන්න ගැන කිසිවකුට පූර්ව විනිශ්චයන් දීමේ නොහැකියාව මත රනිල් මේ මොහොතේ පෙනී සිටින්නේ කුමක් වෙනුවෙන්ද කියන කාරණය ගැන කුහුලක් ඇතිවීම වැළැක්විය නොහැක.**

**රනිල් දේශපාලන බලය අත්පත් කර ගැනීම යැයි සැලකුවේ ජනාධිපති ධුරය ලබා ගැනීම අගමැති ධුරය ලබා ගැනීම, පාර්ලිමේන්තුවේ බහුතරය හෝ විපක්ෂයේ බහුතරයක් හෝ ලබාගැනීම නොවේ. ඒ බලය ඔහුගේ දේශපාලනයට අත්‍යාවශ්‍යම සාධක නොවේ. ඔහුට අවශ්‍ය වූයේ ඔහු පිළිගන්නා දේශපාලන ප්‍රතිපත්තීන් ජයග්‍රාහී තැන තබා ගැනීමය. එය ඔහුගේ එජාපය තුළින් බැරි නම් ඒ මොහොතේ බලයේ සිටින පක්ෂ හෝ පක්ෂ එකමුතුවක් ලවා හෝ කරවා ගැනීම ඔහුගේ අභිප්‍රාය වූවාට සැක නැත.**

**අද දින ඔහු පාර්ලිමේන්තුව හමුවේ කරනු ලැබූ තරමක් සැර කතාව ද පදනම්වන්නේ ඒ මතය...**

**...කොහොම නමුත් රනිල් මතු කරනු ලැබූ කාරණය ගැන ආණ්ඩුවටත් අනෙක් විපක්ෂ කණ්ඩායම්වලටත් හිතන්න, වාද කරන්න බොහෝ දේ ඇත. ජනාධිපතිවරයා සහ අගමැති ප්‍රමුඛ ආණ්ඩුවට යළි තමන් කරමින් සිටින දේ ගැන ගැඹුරින් කල්පනා කරන්නට සිදුවෙනු ඇත. මෙය හරියට අඬන්න සිටින එකාගේ ඇහැට ඇඟිල්ලෙන් ඇන්නා වැනි වැඩකි. කොහොම නමුත් රටට වගකියන පාලක පක්ෂයට දැන් රනිල් මඟහැර යා නොහැකිය. විපක්ෂයට තමන් මෙතෙක් කරපු කියපු දේවල් ගැනත් අඩුම තරමින් දේශපාලනය යනු කුමක්දැයි හෝ කල්පනා කිරීමට හෝ දැන් අවස්ථාවක් ඇත. යළි බලය අත්පත් කරගැනීමට දේශපාලනික උපක්‍රමික මාර්ග තෝරන්නෙ කෙසේදැයි රනිල් අද ලබාදුන් නිදර්ශනය ගැන ඔවුන්ට සිතන්නට සිදුවේ. කොටින්ම රනිල්ගෙන් ඉගෙන ගන්නට තව බොහෝ දේ ඇති බව සියලු විපක්ෂ කණ්ඩායම්වලට තිබෙන බව රනිල් ටොක්කක් ඇණ පෙන්වා දී ඇත.**

**රනිල් පවසන දේ භාරගැනීම හෝ නොගැනීම ආණ්ඩුවත් විපක්ෂයත් සිදු කළද නොකළද ඔහු පෙන්වා දුන් ඇත්ත වෙනස් නොවනු ඇත..."** යනුවෙනි.

ලියුම්කරු එදා කල්පනා කළ පරිද්දෙන් රනිල්ව මඟ හැර යාමට කිසිවකුට නොහැකි වූ අතර අවසානයේ සියළු දෙනා රනිල්ට අභිමුඛ වී පරාජය විය.

එදා මෙදා තුර රනිල් පාර්ලිමේන්තුව තුළත් ඉන් පිටතදීත් ජාත්‍යන්තරය තුළත් බොහෝ දේ කියා ඇත. එමෙන්ම විශාල ක්‍රියාමාර්ග ප්‍රමාණයකට පිවිස ඇත. මේ සියල්ල තුළ එකට එක පෑහෙන සම්බන්ධතා එකිනෙක යා කර ලකුණු කරගැනීමේ සමත්කම තිබේ නම්, රනිල්ගේ ගමන් මගෙහි සිතියම ලකුණු කරගැනීම අපහසු නැත. ඒ අනුව ඔහු යන්න හදන්නේ කොතනටද? කරන්න හදන්නේ කුමක්ද? කියන එක ගැන අදහසකට පැමිණිය හැකිය. අවශ්‍ය නම් දශක 5ක් තිස්සේ කළ කී දේ ගැනද සලකා බැලිය හැකිය. එයද සිහින් හුයකින් වර්තමානය හා ගැට ගැසෙයි. දශක 5ක් තිස්සේ රනිල්ගේ දේශපාලනය නිශ්චිත ඉලක්කයක් කරා දිව යන්නකි. පරාජයන් මෙන්ම ජයග්‍රහණයන් රැසක් සමඟ ඉවසීමෙන් සංයමයෙන් ආ ගමන අද එහි කූඨප්‍රාප්තියට ආසන්නව ඇතැයි කීවාට වැරදි නැත.

බොහෝ විට රනිල් සම්බන්ධයෙන් වරදින තැන, ඔහු කරන කියන දෙයෙහි එකිනෙක සම්බන්ධය නොසලකා හරිමින් එහෙන් මෙහෙන් වෙන වෙනම අල්ලාගෙන කරන **"ඇගයීම"** හෝ **"විවේචනය"** ය. රනිල්ගේ දේශපාලනය තුළ ඔහු සිටින තැන ලකුණු කර ගැනීමට ඉඩකඩක් වෙන් නොවීම තුළ බොහෝ අය නොමඟ යෑම සිදුවේ. රනිල්ගේ විවේචකයන් සාතිශය බහුතරය මෙලෙස නොමඟ ගිය වුන්ය. රනිල්ව තේරුම් ගත් අය රනිල් සමඟ අඛණ්ඩව වැඩ කළේය. අදත් රනිල් සමඟ සිටගන්නන්ට සමත්කම් පාන්නේ රනිල් යන්නේ කොහෙද යන්න වටහාගත් වුන්ය. එතැනට අලුත් පිරිසක්ද දැන් එකතුව සිටී.

විපක්ෂය නියෝජනය කරන නායකයන් විසින් රටේ ආර්ථික අර්බුද සමනය සඳහා තමන්ට විසඳුම් තිබෙන බවත් මාස 6න්, අවුරුද්දෙන් රට ගොඩදැමිය හැකි බවත් කියමින්, ඒ වන විට රනිල් ආර්ථික ප්‍රතිසංස්කරණයන් වෙනුවෙන් ගත් පියවරයන් දැඩිව විවේචනය කරමින් සිටි සමයේදී රනිල් අගමැතිවරයා ලෙස පාර්ලිමේන්තුව හමුවේ (2022 ජූලි 05 දා) ඔවුන්ගෙන් විමසා සිටියේ එවැනි සැලසුම් තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙසය, එහෙම සැලසුම් තිබෙනවා නම් ඒ අයට ඉඩදී තනතුරු අත්හරින්න තමන් සූදානම් බවය.

**"තනතුරු අත්හැර ඒ වැඩපිළිවෙළට සහයෝගය ලබාදීමට සූදානම්. මොකද මම මේ දරන තනතුරු මට අලුත් දේවල් නෙමෙයි. රට අරාජික වෙලා තියෙන වෙලාවක කිසි කෙනෙක් වගකීම භාරගත්තේ නැති වෙලාවක මම මේ තනතුර භාර ගත්තේ පුටුවට ආසාවෙන් නෙවෙයි. ඒ අවස්ථාවේ රට පත්වී තිබුණේ අරාජික සහ අනතුරුදායක තත්වයකට. ඒ තත්වය තවත් වර්ධනය වුනා නම් රට ලේ විලක් බවට පත් වෙන්නට තිබුණා. ලෝකයේ කිසිදු රටක් අප දිහා මිත්‍රත්වයෙන් නොබලන වටපිටාවක් උදා වෙන්න තිබුණා.**

**මේ තනතුර භාරගත්තේ ඒ තත්වයෙන් රට මුදවා ගැනීමේ අරමුණ ඇතිව. මම වගකීම් භාරගත්තේ රට වෙනුවෙන්. මගේ අත්දැකීම් හා සම්බන්ධතා භාවිතා කරමින් රට වැටී ඇති තත්වයෙන් ගොඩ ගැනීමේ අරමුණින්. අන්න ඒ නිසයි කිසිදු කොන්දේසියකින් තොරව මම මේ අරාජික රට භාර ගත්තේ. රට ප්‍රපාතයට ඇද වැටීම වලක්වා ගන්න දැන් අපට පුළුවන් වුණා. දැන් තියෙන්නෙ සෙමෙන් සෙමෙන් යළි රට ඉහළට ඔසවා තබන්න.**

**මට මූලික වුණේ බලය නොවෙයි, රටයි. ඒ නිසා මට බලය පිළිබඳ ආසාවක් හෝ අවශ්‍යතාවයක් නෑ. මට තියෙන්නේ රට ගොඩගැනීම සඳහා වන අවශ්‍යතාවයක් විතරයි. ඒ අවශ්‍යතාවය සපුරා ගැනීමේ මාර්ගයේ අප සැලසුම් සහගතව සහ ස්ථාවරව දැනට ඉදිරියට යමින් සිටින බව මම මේ සභාවට දන්වා සිටින්නට කැමතියි.**

**අප මේ යන ගමන මෙතෙක් අපේ රටේ අනුගමනය කෙරුණු ක්‍රමය වෙනස් කිරීම සඳහා යහපත් පදනමක්. පුද්ගලයන් හෝ චරිත මාරු කිරීමෙන් ජයක් හෝ ප්‍රගතියක් ලබා ගත නොහැකි බව අතීත අත්දැකීම් අපට පෙන්වා දී තියෙනවා. පොදු ජාතික සැලැස්මක් ක්‍රියාත්මක කරලීමේ කරවීමේ වැදගත්කම අතීත අත්දැකීම් ඔස්සේ තහවුරු වී තියෙනවා.**

**ඉතින් දැන් අප අනුගමනය කරන ක්‍රමවේදයටත් වඩා යහපත් මාර්ග ඇත්නම් කරුණාකර පෙන්වා දෙන්න. ඉදිරිපත් කරන්න. රට ඉහළට ඔසවා තැබීමේ වෑයමට අපි සියල්ලම එකතු වෙමු. වැටුණු තැනින් යළි නැඟී සිටීමේ ගමනට එක්සත්ව එක්සිත්ව එකතු වෙමු. සාමූහික අදහස් හා යෝජනා ඔස්සේ මේ ගමන් මඟ වඩාත් නිවැරදි කර ගනිමු..."**

රනිල්ගේ වුවමණාව පැහැදිලිය. නමුත් මේ කතාව වුවත් බොහෝවුන් විශ්වාස නොකරන්නේ රටේ දේශපාලනය, බොරුව, රැවටිල්ල, තක්කඩිකම මත පදනම්ව සැකසී තිබෙන ආකාරය නිසාය. පුරවැසියා, දේශපාලකයා සම්බන්ධයෙන් කල්පනා කරන ජනප්‍රිය ආකාරය නිසාය. කෙසේ නමුත් රනිල් මෙතැනදී අවධාරණය කරන වැදගත් කාරණය, **"...තනතුරු මට අලුත් දේවල් නෙමෙයි... තනතුර භාර ගත්තේ පුටුවට ආසාවෙන් නෙවෙයි... මට මූලික වුණේ බලය නොවෙයි, රටයි. ඒ නිසා මට බලය පිළිබඳ ආසාවක් හෝ අවශ්‍යතාවයක් නෑ. මට තියෙන්නේ රට ගොඩගැනීම සඳහා වන අවශ්‍යතාවයක් විතරයි..."** යනුවෙන් කරන ප්‍රකාශයයි.

රනිල්ව බොහෝ අය කියවගන්නේ ජේ.ආර්. ඉදිරියට රැගෙන ආ යෂ්ඨිය අතයට ගත් තැනැත්තා ලෙසය. ජේ.ආර්. ජයවර්ධන වරෙක කියා සිටියේ තමන්ට රකින්න පරපුරක් නැති බවය. ඔහුට නොබියව රටේ ආර්ථික හා දේශපාලන ප්‍රතිසංස්කරණයන් ක්‍රියාත්මක කරන්න හැකි වූයේ ඒ නිසාය. ඔහු මුළුමනින්ම කල්පනා කළේ රටේ අභිවෘද්ධිය ගැන පමණය. ඒ ජේ.ආර්.ට මෙන්ම රනිල්ටද රකින්න පරපුරක් නැත. ඔහුගේ අරමුණද රටය. කොටින්ම සිය පක්ෂය වන එක්සත් ජාතික පක්ෂයද රටේ වුවමණාවට යටත් කර පක්ෂ බල දේශපාලනයෙන් එය ඈත් කර තිබේ.

**"...මම අගමැති වගකීම් භාරගත් අවස්ථාවේ විපක්ෂයේ පක්ෂ වෙතින් ලිඛිතව ඉල්ලීමක් කළා, මේ අසීරු හා අර්බුදකාරී අවස්ථාවේ රට වෙනුවෙන් එක්ව කටයුතු කරන්නට ඉදිරිපත් වෙන්න කියා. ඒ අවස්ථාවේ රට ලැබුණු ප්‍රතිචාර ගැන ඔබ හැමදෙනාම දන්නවා... මම යළිත් මේ සභාවේ සිටින සියළුම පක්ෂ නියෝජිතයන්ගෙන් යළිත් ඉල්ලා සිටින්නේ මේ අභියෝගය ජයගැනීමට එකට එක්වෙන ලෙසටයි.**

**අපේ අවසාන ඉලක්කය ඉහළ තරගකාරීත්වයකින් යුතු සමාජ වෙළඳපොල ආර්ථිකයක් නිර්මාණය කරගැනීමයි..."** යනුවෙන් රනිල් සියලු දේශපාලන පක්ෂවලට ආයාචනයක් කළේ තව දුරටත් පක්ෂ

09 පිටුවට

08 පිටුවෙන් දේශපාලනය තුළට වැදී රට අර්බුදයට යැවීමෙන් වැලකීම මේ මොහොතේ වඩා වැදගත් වන නිසාය. රට ගොඩගැනීමෙන් පසුව අවශ්‍ය නම් පක්ෂ දේශපාලනයට පිවිසෙමු යනුවෙන්ද රනිල් ඉල්ලා සිටියේ, ඔහුට වඩා වැදගත් වන්නේ රට නිසාය. ජනතාව නිසාය.

මේ අවධාරණ කළ කරුණුවලට එපිටින් පක්ෂ දේශපාලනය බදාගෙන පක්ෂ දේශපාලන න්‍යාය පත්‍රයන්ට අනුව තීන්දු තීරණ ගන්නා තැනට මේ ගෙවුණු අවුරුද්දක කාලය තුළ රනිල් පියවර ගෙන නැත. ඔහු පෙනී සිටින්නේම රට වෙනුවෙන් අවශ්‍ය අනිවාර්ය කාර්යභාරය ඉටු කරමින් පුරවැසියාට යහපත් හෙටක් ගොඩනගාදීම ගැන වන අරමුණෙනි. ජනප්‍රිය දේශපාලන භාවිතාව වෙනුවට දුෂ්කර අවදානම්කාරී තීන්දු තීරණවලට එළැඹෙමින් අතිශය සංකීර්ණ තත්වයන් හා ගැටෙමින් ඔහු ක්‍රියාත්මක වන්නේ ඔහු පතන සංවර්ධිත ශ්‍රී ලංකාව ගොඩනැගීම වෙනුවෙන් මිස ඔහුටවත් ඔහුගේ පරපුරකට තබා පක්ෂය වෙනුවෙන්වත් නොවන බව පැහැදිලි කරුණකි.

කොහොම නමුත් පක්ෂ දේශපාලනය ව්‍යාජයක්ව අවසන් වී දැන් කාලයක් ගත වී තිබේ. පක්ෂ හැටහුටාමාරක් තිබෙන රටේ මැතිවරණ දේශපාලනයේදී ඒවා සන්ධාන බවට පත් වේ. බලය අත්පත් කරගත්තා නොගත්තා හෝ වේවා මෙම සන්ධාන නැවත නැවත කැඩී වෙන් වෙමින් නැවත නැවත සන්ධානගත වේ. මුලින් පෙන්වන මතවාදී වෙනස්කම් ප්‍රතිපත්ති වෙනස්කම් පහු පහු වෙනවිට හඳුනාගත නොහැක. මේ නිසා කිසිදු පක්ෂයකට නිශ්චිත මතවාදයක් ප්‍රතිපත්තියක් අඛණ්ඩව පවත්වාගෙන යෑමේ හැකියාව අද නැත. අනෙක අද තිබෙන පක්ෂ බහුතරයක් යනු යම් අයකුගේ, පවුලක, මිතුරු කැළක පුද්ගලික දේපොළක්, බුදලයක් හෝ ව්‍යාපාරික සමාගමක් ආදි ලෙස පවතින ඒවාය. දේශපාලන අරමුණුවලට වඩා ඇත්තේ වෙනත් අරමුණුය. ඒ අරමුණු වෙනුවෙන් ඒවා නම්‍යශීලී වන්නේ හිතාගන්නට නොහැකි තරම් වේගයකිනි. කොහොම වෙතත් පක්ෂ දේශපාලනය කවර හැඩයක් ගත්තත් රටෙත්, පුරවැසියාගේත් අභිවෘද්ධියට යටත්ව එසේ සිදු වෙනවා නම් එහි ගැටළුවක් නැත. එහෙත් බොහෝ විටම දකින්නට ලැබුණේ කෙටි කාලීන සිල්ලර දේශපාලන වුවමණාවන්, බඩගෝස්තරය වෙනුවෙන් ගන්නා අවස්ථාවාදි තක්කඩි පියවරයන් ලෙස පමණි. අද රනිල් විරෝධයක්, ආණ්ඩු විරෝධයක් නඩත්තු කරගැනීම වෙනුවෙන් පෙළ ගැසී සිටින කණ්ඩායම්වල ක්‍රියාකාරිත්වය දෙස බැලීමේදී මේ විකාරය පැහැදිලිය. ඒ තබා ආණ්ඩු පක්ෂයටමත් සහයෝගය දෙන පක්ෂ කණ්ඩායම් තුළත් මේ විකාරයම සිදුවෙමින් පවතී. මේ විකාරකාරී තත්වයන් තවදුරටත් රටට අවශ්‍ය වන්නේ නැත. රට මේ අර්බුදයෙහි ඇද දැමීමටත් මේ තත්වයන් හේතුවක් වූ අතර, මේ විකාර පක්ෂ දේශපාලනය මේ වන විට කල් ඉකුත්ව තිබෙන්නකි. රනිල් දේශපාලන පක්ෂවලින් ඉල්ලා සිටින්නේ මේ විකාරය නවත්වා නිශ්චිත අරමුණක් වෙනුවෙන් එකතු වී මේ කඩා වැටුණු රට ගොඩනැගීමට දායක වන ලෙසය. රනිල්ව තේරුම් ගැනීමට අවශ්‍ය නම් රනිල් මේ සිටින ස්ථාවරය තුළ බහා ඔහු කරන කියන දේවල් දෙස බැලිය යුතුය.

අද ආණ්ඩු පක්ෂය නියෝජනය කරන පොදුජන පෙරමුණේම ඇතැම් නායකයන් සිය හිතවතුන් ආධාරකරුවන් (පාක්ෂිකයන් කියා කොටසක් දැන් කිසිදු දේශපාලන පක්ෂයකට නැත) ඉදිරියෙහි තබාගෙන ඉදිරි ජනාධිපතිවරණ අපේක්ෂකයා ගැන විවිධ කතන්දර කියමින් සිටී. තමන්ගේම පක්ෂයේ සුජාත අපේක්ෂකයෙක් ඉදිරිපත් කරන බව කියමින් සිටී. ආර්ථිකය හදන්න කෙනෙක් ඕනෑ නම්, තරුණ නායකයෙක් ඕනෑ නම්, ජාතික ආරක්ෂාව සහතික කරන්න ඕනෑ නම්, ජාත්‍යන්තර සබඳතා සහිත කෙනෙක් ඕනෑ නම් ඒ ඕනෑම එකකට ගැලපෙන අපේක්ෂකයෙක් තමන්ට ඉදිරිපත් කළ හැකි බවත් කියයි. මේ අයම වැඩකරන විරුවකු ගෙනවිත් කළ හදිය ගැන මොවුන්ට දැන් අමතක වී ඇති සෙයකි. තවත් වරෙක කියා තිබුණේ රනිල්ට ඉදිරි ජනාධිපති අපේක්ෂකයා වෙන්න ඕනෑ නම් තමන්ගේ පොහොට්ටුවේ සාමාජිකත්වය ගත යුතු බවය. නමුත් තමන්ට ඕනෑම ආකාරයක අපේක්ෂකයන් සිටිනවා කියන පක්ෂයකට රනිල්ට නැවත කතා කරන්න අවශ්‍ය වන්නේ නැත. නමුත් ඇත්ත දේ නම් රනිල් නොමැතිව වෙන විකල්ප නැති බවය. තමන්ගේ කියා කිසිවක් නැති බවය. කොටින්ම දැන් පක්ෂයක්ද නැත. රටේ පැවැත්ම කෙසේ වෙතත් තමන්ගේ පැවැත්මට රනිල්ව මේ අයට අවශ්‍යය. රනිල් ඉන්න තැන හෝ ආණ්ඩු පක්ෂ කණ්ඩායම තුළදී එකක් කියන්නයි හිතවතුන් ආධාරකරුවන් ඉදිරියේ තව එකක් කියන්නයි වෙන්නේ ඒ නිසාය.

විපක්ෂයට වී ඇත්තේත් මේ ඇබැද්දියමය. රනිල් නිවැරදි බව දැන දැනම තම හිතවතුන් ආධාරකරුවන් චූන් කර තබා ගැනීම වෙනුවෙන් බොරු කියන්නට සිදුව තිබේ. සජබයේ ආර්ථික ඔස්තාර්ලා රනිල් ගන්නා පියවරයන් නිවැරදි බවත් ඊට සහය දෙන බවත් කියන විට සජිත්ට හිතවතුන් ආධාරකරුවන් ඉදිරියට ගොස් කියන්න සිදුව ඇත්තේ රනිල් රට කනවා කියාය. මන්ද රනිල් හරි කිව්වොත් හිතවතුන් ආධාරකරුවන් ඉතිරි නොවන්නේ යැයි සජිත් හිතන නිසාය. ජවිපෙ මුහුණ දී ඇති ගැටළුවත් මෙයය. තමන්ට කියා දෙයක් නැත. නමුත් තිබෙනවා යැයි ව්‍යාජයක් නඩත්තු කරන්නට සිදු තිබේ. පරණ පක්ෂ දේශපාලන හණ මිටි කරතබා ගෙන සිටින තාක්කල් මේ ව්‍යාජය නඩත්තු කරන්නට සිදු වේ. එජාපයටත් මේ ගැටළුවට මුහුණ දීමට සිදුවීම අනිවාර්යයකි. එජාපයට ජනාධිපති රනිල් තමන්ගේ නියෝජිතයකු යැයි කල්පනා කරන්නට ඉඩක් විවරව තිබේ. නමුත් එජාපයට රනිල් කියන්නේ පක්ෂයේ නායකයා විය යුතුවීම මිසක ජනාධිපති තමන්ගේ පක්ෂයේ නියෝජිතයා නොවිය යුතුය. රනිල් යනු කාගෙවත් නියෝජිතයකු නොවේ. රට ගොඩගන්න රටට ඉතිරිව ඇති එකම විකල්පයයි. එතැන පක්ෂයක් අදාල නැත. පක්ෂ යනු ව්‍යාජයක් වීම තුළ කොහොමටවත් අදාලත්වයක් නැත. නමුත් එජාපය එය වටහා නොගත්තොත් එජාපයට "ජනාධිපති රනිල්" අහිමි විය හැකිය.

පැරණි දේශපාලනය අද වෙනස් වන්නේ මේ රනිල් නම් සාධකය නිසාය. එය ඉවත් කළ නොහැක. එය වෙනස් කළ නොහැක. ඒ සඳහා ගන්නා උත්සාහයන්ගෙන් ද වැඩක් වන්නේ නැත. එය අනිවාර්ය තත්වයක් වනවා සේම එය යථාර්ථය ලෙස පිළිගැනීමට සිදු වේ. මන්ද යත් රනිල් හැර වෙන විකල්ප නැති බැවිනි. නමුත් රනිල් යනු හුදු පුද්ගල සාධකයක් ලෙස තේරුම් නොගත යුතුය. එසේ වීම නැවත වරද්දා ගැනීමකි. රනිල් යනු ක්‍රමවේදයකි.

ජයතුංග බණ්ඩාර

# ශ්‍රී ලංකාවේ ක්‍රිකට් යනු Sri Lanka Cricket ද?

ශුද්දාගෙන් ශ්‍රී ලංකාවට ලැබුණු දෑ බොහෝය. ඒ අතර ආර්ථික වටිනාකම් සහිත බෝගයන් වන තේ, රබර්, කෝපි, කුරුඳු, කොකෝවා වැනි වතු වගා ක්‍රමයන් හඳුන්වා දිය හැකි අතර එම භෝගයන්ගේ ලෝක සන්නාමයන්ද ලංකාවට හිමිකර ගැනීමට සමත් විය. ලොව පුරා Ceylon Tea යන්න අදටත් ජනප්‍රිය වී ඇත. ලංකාවේ තේ වගේම සුද්දා විසින් හඳුන්වා දුන් ක්‍රිකට් ක්‍රීඩාව නිසා ලංකාවට ලෝක ශූරයන් වීමටද හැකි විය. ශ්‍රී ලංකාව යන්න ලෝක සිතියමේ කොහිද යන්න නොදත් ලොව පුරා ක්‍රිකට්වලට ආදරය කරන්නන් ක්‍රිකට් නිසා ලංකාව ගැන දැන ගැනීමට තරම් ලංකාවේ ක්‍රිකට් ඉහළට ආවේය. එම නිසා සිලෝන් ටී මෙන්ම සිලෝන් ක්‍රිකට් ද ලෝක අවධානය දිනා ගත්තේය. පසුව ශ්‍රී ලංකන් ක්‍රිකට් යන්න ක්‍රිකට් ක්‍රීඩා ඉතිහාසයේ වැදගත් පරිච්ඡේදයක් විය.




ලංකාවේ ජනප්‍රියම ක්‍රීඩාව ක්‍රිකට්ය. සුද්දාගේ කාලයේ පටන් ක්‍රිකට් ක්‍රීඩාව ලංකාවේ මුල් ඇදගත් ක්‍රීඩාවක් බවට පත් විය. ලංකාව නිදහස ලැබීමෙන් අනතුරුවද දැවැන්ත ක්‍රිකට් ලෝලීන් පිරිසක් හා ක්‍රීඩකයන් පිරිසක් ලංකාව තුළ බිහි විය. පසුගිය දශක පහක පමණ කාලය පුරාවට ලංකාවේ ක්‍රීඩාවක් ගැන කතා කරනවා නම් එහිදි මුල් තැන් ලා කතා කළේ ක්‍රිකට් ගැනය. එදා මෙදා තුර ක්‍රිකට් දැවැන්තයින් ලංකාව තුළ බිහි බිය. ටෙස්ට් ක්‍රිකට් වංශ කතාව 1882 දී ආරම්භය සනිටුහන් කරන අතර 1926-1927 වසරවලදී කොළඹ වික්ටෝරියා උද්‍යානයේ නොමැඩ්ස් ක්‍රීඩාපිටියේදී MCC කණ්ඩායමට එරෙහිව "සිලෝන් කණ්ඩායම" ලෙස ප්‍රථම වරට තරග වැදුණි. එහිදී 'සිලෝන්' කණ්ඩායම ඉණිමක පරාජයක් ලැබීය. සිලෝන් කණ්ඩායම සිය ප්‍රථම ජයග්‍රහණය වාර්තා කරන්නේ 1932 - 1933 වසරවලදී පැටියල (Patiala) කණ්ඩායමට එරෙහිවයි. ඒ ඩිරුව් "පැන්ඩෝව්" ක්‍රීඩාංගනයේදී සිලෝන් කණ්ඩායම 1950 සිට එම්.ජේ. ගෝපාලන් කුසලානය සඳහා තරග වැදුණු අතර 1970 දී 'සිලෝන්' කණ්ඩායම 'ශ්‍රී ලංකා' ලෙස සිය නම වෙනස් කළේය. ශ්‍රී ලංකා ජාතික ක්‍රිකට් කණ්ඩායම ලෙස පළමු වරට ජාත්‍යන්තර ක්‍රිකට් තරඟයකට සහභාගී වූයේ 1975 වර්ෂයේදීය. 1981 දී ටෙස්ට් වරම් ලැබීමෙන් පසුව ටෙස්ට් වරම් ලැබූ 8 වෙනි රට බවට ශ්‍රී ලංකාව පත් විය.

ලංකාවේ ක්‍රිකට් බල පරාක්‍රමය ලොව පුරා පිහිට වූයේ 1996 දී එක් දින ලෝක කුසලානය හිමි කර ගැනීමත් සමඟය. එදා සිට මෙදාටත් එදා සිටි ඉන් එපිටටත් ක්‍රිකට් පිළිබඳ දන්නා කතාවක් ඇත. ඒ ක්‍රිකට් ක්‍රීඩාව ලංකාව තුළ ක්‍රීඩාවක් ලෙස මෙන්ම ආර්ථිකමය ප්‍රතිලාභයන් අත්පත් කර දීමට සමත් කර්මාන්තයක් ලෙස වර්ධනයවීමය.

"ශ්‍රී ලංකා ක්‍රිකට්" ආයතනය යනු ලෝක ක්‍රිකට් කවුන්සිලයේ රෙගුලාසි නිර්දේශ ආදියට යටත් ආයතනයකි. එය රජයෙන් ස්වාධීන සමාගමකි. එහෙත් රජයට ආර්ථිකමය ප්‍රතිලාභයන් අත්පත් කරදීමට ගොඩ නැගුණු ධන නිධානයකි.

වර්ෂයකට ඩොලර් මිලියන 35ක පමණ මුදලකින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ගිණුම තර වෙන අතර එය සෘජුව මහා භාණ්ඩාගාරයට බැර නොවුනද වක්‍රව දේශීය ආදායම් සංචිතයෙහි ආදායමක් ලෙස සනිටුහන් වේ. මේ නිසා ශ්‍රී ලංකා ක්‍රිකට් යනු සෘජුව ලැබෙන ආදායම් සහිතව හා වක්‍රව ලැබෙන ආදායම් සහිත ආයතනයකි. ඒ අනුව ශ්‍රී ලංකා ක්‍රිකට් යනු හුදු සෙල්ලම් මඩුවක් නොවේ. කෙසේ නමුත් මෙරට ක්‍රීඩා අණ පනත් අනුව ක්‍රීඩා අමාත්‍යාංශයෙහි අධීක්ෂණයට යටත්ව පවතින හා වගකිම් සහිත ආයතනයක් වන ශ්‍රී ලංකා ක්‍රිකට් සංවිධිතගත නීති පද්ධතියකින් පෝෂණය වන ආයතනයකි. ඉතිහාසය හා හැඳින්වීම් ගොන්නක් මේ ලෙස දිගහැරිය හැකි නමුත් වැදගත් වන්නේ ශ්‍රී ලංකාවේ ක්‍රිකට් වර්තමානයේ තිබෙන තත්වය ගැන හා එය විසින් කෙතරම් ප්‍රමාණයකට ලංකාවේ සංවර්ධනයට උපයෝගී වන්නේද යන්න පිළිබඳව සාකච්ඡා කිරීමය.

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට ඔවුන්ගේ අභිමතය පරිදි සකසා ගත් හා ලෝක ක්‍රිකට් සම්මේලනයේ නීති රීතීන්ට අනුගතව ක්‍රියා කළ හැකිය. එහෙත් ලෝක ක්‍රිකට් කවුන්සිලය විසින් එම රට තුළ වන ස්වාධීනත්වයට ගරු කරමින් ක්‍රිකට් හැසිර විය හැකි බවට වන නීති රීති සමුදායක් ද යොදා ඇත.

ඒ අනුව ක්‍රිකට් ක්‍රීඩකයන් මිල වන්නේද, මිලදී ගන්නන් වන්නේද, අභිමත පරිදි ක්‍රීඩා කළ හැකි වන්නේද ලෝක ක්‍රිකට් කවුන්සිලයට අනුගතවය. එසේම ක්‍රිකට් ලංකාව තුළ මෙන්ම ඉන් පිටතදීද ධනය ඉපයීම හා එහි ප්‍රතිලාභ රටට අත්කරදීම සඳහා ක්‍රිකට් ආයතනයේ පරිපාලනයට හැකියාව ඇත. මේ හේතුවෙන් වර්තමානයේ ක්‍රිකට් බලධාරීන් ඔවුන්ගේ පාර්ශ්වයෙන් කොතරම් දුරට මෙකී කාර්ය භාර්යයන් ක්‍රිකට් රැකගෙන සිදුකරන්නේද යන්න ගැටළු සහගතය. පසුගිය කාලයේදී මාධ්‍ය ඇතුළු වෙනත් පාර්ශ්ව විසින් ශ්‍රී ලංකා ක්‍රිකට් සම්බන්ධයෙන් මතු කළ විවේචනයන් කොතරම් දුරට ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් කළ විවේචනදැයි නැවත සිතා බැලිය යුතුය.


තත්වයන් කෙසේ වුවත් සිදු විය යුතු වන්නේ රටක අභිමානයට බලපෑම් කළ හැකි හා රටක ආර්ථිකයට බලපෑම් කළ හැකි ජාත්‍යන්තර වපසරියක් ආවරණය කරන ක්‍රීඩාවක් සතු වගකීම් සහගත බව පරමාදර්ශී කොට ගෙන ශ්‍රී ලංකාවේ ක්‍රිකට් රටේ සංවර්ධනයට සඳහා උපයෝගී කර ගත හැකි අයුරින් නගා සිටුවීමය. ඒ සඳහා අවශ්‍ය සම්පත් හා බලවේග මෙන්ම සවිමත්බව "ශ්‍රී ලංකා ක්‍රිකට්" ආයතනය සතුව ඕනෑවටත් වඩා පවතී. ශ්‍රී ලංකා ක්‍රිකට් රටේ සංවර්ධනයට සඳහා දායක වනවා කියන්නේ ක්‍රීඩාවක් ලෙස ක්‍රිකට් පෝෂණය කිරීම මෙන්ම රටට කීර්තිය සහ ප්‍රතිලාභ ලබාදීමය.

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට මෙන්ම ක්‍රීඩා අමාත්‍යාංශයටද ක්‍රිකට් කඩා වැටීමේ අර්බුදයෙන් කර හැරිය නොහැක. ශ්‍රී ලංකා ක්‍රිකට් යනු අමාත්‍යවරයාගේ, ඔහුගේ උපදේශකයන්ගේ හෝ ආයතනයේ හෝ මාධ්‍ය ආයතනවල තනි අයිතියක් නොව. එය ශ්‍රී ලාංකිකයන්ගේ අයිතියකි. එනිසා එය පුද්ගලයන්ට අවශ්‍ය ලෙස නොව ශ්‍රී ලාංකික ජනතාවට අවශ්‍ය ලෙස කළමනාකරණය විය යුතුය. මාධ්‍යයක් ලෙස අප පෙනී සිටින්නේ Sri Lanka Cricket නැමති ආයතනයට පක්ෂව හෝ විපක්ෂව නොව ශ්‍රී ලංකාවේ ක්‍රිකට්වලට පක්ෂවය. ඒ වෙනුවෙනි.

නිහජ ජයසිංහ

# රුසියා-යුක්රේන යුද උණුසුමට දිය වෙන ලෝක ආර්ථිකය

රුසියානු - යුක්රේන යුද්ධය රටවල් දෙකක ගැටුමක් වුවද එය මේ වන විට ගෝලීය ආර්ථිකයට පුළුල් පරාසයක බලපෑම් ඇති කර තිබේ. සැපයුම් දාම කඩාකප්පල් කර, උද්ධමනය උග්‍ර කර ඇති අතර ලොව පුරා ආර්ථික අවිනිශ්චිතතාවය ඉහළ නංවා ඇත. දෙවන ලෝක යුද්ධයෙන් පසු යුරෝපයේ විශාලතම මිලිටරි මෙහෙයුම සනිටුහන් කරමින් රුසියාව, යුක්රේනය ආක්‍රමණය කිරීමත් සමඟ ගැටුම ආරම්භ වූයේ 2022 පෙබරවාරි මාසයේදීය.



### ඓතිහාසික සන්දර්භය

රුසියාව සහ යුක්රේනය අතර සංකීර්ණ සහ ඓතිහාසික සම්බන්ධතාවයක් ඇත. යුක්රේනය වරක් සෝවියට් සංගමයේ කොටසක් වූ නමුත් 1991දී එහි බිඳවැටීමෙන් පසුව නිදහස ලබා ගත්තේය. රුසියාව 2014දී ක්‍රිමියාව, යුක්රේනයෙන් රුසියාවට ඈඳාගත් අතර නැගෙනහිර යුක්රේනයේ බෙදුම්වාදී කණ්ඩායම්වලට සහාය දුන්නේය. 2022 දී රුසියාව යුක්රේනයේ දේශ සීමා අසල හමුදා රැස් කිරීමත් සමඟ යුක්රේනය නේටෝවෙන් ආරක්ෂක සහතික ඉල්ලා සිටියේය. ඒ සමඟම දෙරට අතර ගැටුම උත්සන්න විය. පෙබරවාරි 24 වන දින රුසියාව යුක්රේනයට පූර්ණ පරිමාණ වශයෙන් ආක්‍රමණයක් දියත් කළේය. (රුසියානු ජනාධිපති ව්ලැඩිමීර් පුටින් **"විශේෂ මිලිටරි මෙහෙයුමක්"** යනුවෙන් මෙය නිවේදනය කළේ, ඩොනෙට්ස්ක් සහ ලුහාන්ස්ක් සමූහාන්ඩු, ඩොන්බාස් ගැටුමේ දී යුක්රේනයට එරෙහිව සටන් කරමින් සිටි මිලිටරි හමුදාවන්ට සහය දැක්වීම සඳහාය)

### ගෝලීය ආර්ථිකය මත බලපෑම

මේ වන විට මෙම යුද්ධය තෙල්, ස්වභාවික ගෑස් සහ අනෙකුත් භාණ්ඩවල මිල ඉහළ යාමට හේතු වී ඇත. රුසියාව සහ යුක්රේනය තෙල්, ස්වභාවික ගෑස්, තිරිඟු සහ බඩ ඉරිඟු වැනි භාණ්ඩවල ප්‍රධාන අපනයනකරුවන් වේ. යුද්ධය හේතුවෙන් මෙම අපනයන කඩාකප්පල් වී ඇති අතර ලොව පුරා උද්ධමනය ඉහළ ගොස් මිල ඉහළ යාමේ පීඩනයක් ඇති කර තිබේ. එමෙන්ම ජාත්‍යන්තර වෙළෙඳාමට හා ආයෝජනවලට ද බලපෑම් එල්ල වී ඇත. සම්බාධක හේතුවෙන් බොහෝ සමාගම් රුසියාව තුළ මෙහෙයුම් නතර කර හෝ ඉවත් කර ඇති අතර යුක්රේනයේ ද අපනයන සහ ආනයන තියුණු ලෙස පහත වැටී ඇත. රුසියානු බලශක්තිය මත දැඩි ලෙස රඳා පවතින යුරෝපීය සංගමය, භාණ්ඩ මිල ඉහළ යාම සහ සැපයුම්දාම කඩාකප්පල්වීම් හේතුවෙන් මන්දගාමී ආර්ථික වර්ධනයක් සහ ඉහළ උද්ධමනයක් අත්කර දී තිබේ.

### රුසියාවේ ආර්ථිකයට බලපෑම

සම්බාධක සහ එහි ආක්‍රමණයේ ප්‍රතිවිපාක නිසා රුසියාවේ ආර්ථිකයට දැඩි ලෙස පහර වැදී ඇත. රුසියාවේ රූබල් මුදල් ඒකකය ආක්‍රමණයෙන් පසුව ඩොලරයට සාපේක්ෂව එහි වටිනාකමෙන් 40%ක් පමණ අහිමි වූ නමුත් එතැන් සිට එය නැවත ඉහළ ගොස් ඇත. උද්ධමනය දශක දෙකක කාලයක් තුළ එහි ඉහළම අනුපාතය දක්වා ඉහළ ගොස් ඇති අතර රුසියානු මහ බැංකුව එහි ප්‍රධාන පොලී අනුපාතය දෙගුණ කර ඇත. බොහෝ ජාත්‍යන්තර සමාගම් රුසියානු වෙළඳපොළෙන් ඉවත් වී ඇති අතර සම්බාධක හේතුවෙන් රුසියාවට විදේශ ප්‍රාග්ධනයට ප්‍රවේශය සහ ප්‍රධාන භාණ්ඩ ආනයනය සීමා කර ඇත. ආර්ථික සහයෝගිතාව සහ සංවර්ධනය සඳහා වූ සංවිධානයට (OECD) අනුව 2023 වසරේදි රුසියානු දළ දේශීය නිෂ්පාදිතය 2.5%කින් සහ ලෝක බැංකුවට අනුව 0.2%කින් පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට අනුව 0.7%ක වර්ධනයක් පුරෝකථනය කරයි.

### යුක්රේනයේ ආර්ථිකයට බලපෑම

යුක්රේනයේ ආර්ථිකය, යුද්ධයෙන් මුළුමනින්ම විනාශ වී ඇත. යටිතල පහසුකම් විනාශ කිරීම සහ ප්‍රධාන වරායන්ට ප්‍රවේශය අහිමිවීම හේතුවෙන් යුක්රේනයේ අපනයන 2022 වර්ෂයේදී තියුණු ලෙස පහත වැටිණි. රජය වෙනත් ප්‍රමුඛතාවලින් ඉවත්ව යුද්ධය සඳහා විශාල වශයෙන් වියදම් කරමින් සිටී. රුසියාව රට ආක්‍රමණය කළ වසර වන 2022දී 29.2%ක බරපතල හැකිළීමකින් පසුව, යුක්රේනයේ ආර්ථිකය මේ වසරේ 0.5%කින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත. ආක්‍රමණයේ ප්‍රතිඵලයක් ලෙස යුක්රේනය අත්විඳින ආර්ථික හානිය අතිමහත් වන අතර, යුක්රේනයේ කළු මුහුදේ වරායන් යළි විවෘත කිරීම සහ ධාන්‍ය වෙළඳාම නැවත ආරම්භ කිරීම මෙන්ම සැලකිය යුතු පරිත්‍යාග ශීලීන්ගේ සහයෝගය මේ වසරේ ආර්ථිකය වර්ධනය සඳහා බලපා ඇත. මෑත කාලීන ලෝක බැංකු ඇස්තමේන්තුවලට අනුව, යුක්රේනයේ ප්‍රතිනිර්මාණය කිරීමේ සහ ප්‍රකෘතිමත් කිරීමට අවශ්‍ය පිරිවැය ඩොලර් බිලියන 411 දක්වා වර්ධනය වී ඇති අතර එය 2021දී යුක්රේනයේ පූර්ව යුද ආර්ථිකය මෙන් දෙගුණයකට වඩා වැඩිය. යුද්ධය අවසන්වීමෙන් පසුව පවා ආර්ථිකය මන්දගාමී හා අසමාන ලෙස යථා තත්ත්වයට පත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### යුක්රේන සරණාගත අර්බුදය

2023 අප්‍රේල් මස ආරම්භය වන විට, යුක්‍රේනියානු සරණාගතයින් මිලියන 8.1කට අධික ප්‍රමාණයක් යුරෝපීය රටවලට පැමිණ සිටින බව එක්සත් ජාතීන් විසින් වාර්තා කර ඇත. තාවකාලික ආරක්ෂාව හෝ ඒ හා සමාන තත්වය දරන්නන් සංඛ්‍යාව ජනවාරි අග සිට මිලියන 5ක් පමණ දක්වා වැඩි වී ඇත.

පෝලන්තය තවමත් විශාලතම විශේෂ වීසා ලබා දෙන යුරෝපිය රට ලෙස යුක්‍රේනියානු සරණාගතයින් මිලියන 1.58කට පමණ තම රටට පැමිණීමට ඉඩ ලබා දී ඇත. ඉන්පසුව, යුක්රේනය අසල්වැසියෙක් නොවන රටවල් අතරින් ජර්මනියේ වැඩිම යුක්රේන සරණාගතයින් සංඛ්‍යාවක් සිටින අතර, ඔවුන් මිලියනයකට ආසන්න වේ. (ඔවුන්ගෙන් 922,000ක් තාවකාලික ආරක්ෂාවක් ඇත). චෙක් ජනරජය 500,000ක් පමණ තාවකාලික ආරක්ෂාවක් ලබා දී ඇති අතර සමස්තයක් ලෙස තුන්වන ස්ථානයේ සිටී. අනෙකුත් යුරෝපීය රටවල් අතරට එක්සත් රාජධානිය, ඉතාලිය, ස්පාඤ්ඤය, බල්ගේරියාව, රුමේනියාව, ප්‍රංශය සහ ස්ලෝවැකියාව ඇතුළත් වන අතර ඔවුන් යුක්රේන සරණාගතයින් 100,000ක් සඳහා විශේෂ වීසා බලපත්‍ර නිකුත් කර ඇත.

යුක්රේන සරණාගතයින් සැලකිය යුතු පිරිසක් අනෙකුත් විදේශයන්හි සරණාගතභාවය සොයා ගෙන ගොස් ඇත. පසුගිය පෙබරවාරි මාසයේ සිට යුක්රේනියානුවන් 400,000කට වැඩි පිරිසක් කැනඩාවට සහ එක්සත් ජනපදයට ගොස් ඇත. රටවල් දෙකම යුක්රේන සරණාගතයින් සඳහා විශේෂ වීසා ක්‍රම හඳුන්වා දී ඇත. කැනඩාවේ රැඳී සිටීමට කැමති අය කැනඩා - යුක්රේනය හදිසි ගමන් සඳහා අවසරය (CUAET) වැඩසටහන හරහා ඇතුළත් කර ගන්නා අතර, එමගින් ඔවුන්ට රැකියා සහ අධ්‍යයන බලපත්‍ර ලබා ගත හැකිය. කැනේඩියානු බලධාරීන් මේ වන විට අයදුම්පත් මිලියනයකට ආසන්න ප්‍රමාණයක් ලියාපදිංචි කර ඇත.

එක්සත් ජනපදයට ආසන්න වශයෙන් යුක්රේනියානු සරණාගතයන් 270,000 පැමිණ ඇති අතර බොහෝ දෙනෙකුට තාවකාලික ආරක්ෂිත තත්ත්වය හෝ (2022 අප්‍රේල් 1දාට පසු පැමිණි අය සඳහා) යුක්රේනය සඳහා එක්සත් කිරීමේ (Uniting For Ukraine - U4U) වැඩසටහන යටතේ ලබා දී ඇති විශේෂ මානුෂීය වීසා බලපත්‍රයක් ලබා දී ඇත.

රුසියාව සහ යුක්රේනය අතර යුද්ධය මේ වන විට මානුෂීය අර්බුදයක්, ආර්ථික අස්ථාවරත්වයක්, ජාත්‍යන්තර සබඳතා බිඳ වැටීමක් ඇති කර තිබෙන අතර ගැටුම විසඳීම සඳහා අඛණ්ඩ රාජ්‍ය තාන්ත්‍රික ප්‍රයත්නයන් ද මේ වන විට ඇතිව තිබේ. මිලියන 8කට වැඩි අවතැන් වුවන්ට අමතරව තවත් මිලියන ගණනක ජනතාවක් පීඩාවට පත්ව සිටිති. ජීවිත දහස් ගණනක් අහිමි වී ඇත. මෙම ගැටුම කලාපයේ ජනතාවට ද විනාශකාරී බලපෑමක් ඇති කර තිබේ. රුසියාව සහ යුක්රේනය අතර කලාපයේ සහ ඉන් ඔබ්බෙහි අනෙකුත් රටවල් සමඟ සබඳතා ද පළුදු කර ඇත.

තවදුරටත් යුද්ධය අවසන් නොවීම මත මෙම තත්වයන් වර්ධනය වෙනු ඇත. එය ලෝක පරිමාණයෙන්ම බරපතල හානි ගෙන එනු ඇත. මේ නිසා යුද්ධය අවසන් කිරීම අත්‍යාවශ්‍ය සහ කඩිනම් කාරණයක් විය යුතුව තිබේ. එය රුසියාව සහ යුක්රේනය අතර විශ්වාසය සහ සහයෝගීතාව ගොඩනැගීම, කලාපයේ ස්ථාවරත්වය ප්‍රවර්ධනය කිරීම සහ ගැටුමෙන් පීඩාවට පත් වූවන්ගේ දුක් වේදනා අවම කිරීම සඳහා මේ මොහොතේ ගත හැකි ධනාත්මක පියවරක් වනු ඇත.

නිරෝෂන් පෙරේරා

**යුක්රේනය ආක්‍රමණයට පෙර සහ පසු බලශක්ති මිල ගණන්**




Sources: Refinitiv, Bloomberg and ECB staff calculations.
Notes: Oil prices are Brent crude oil prices, gas prices are the Dutch Title Transfer Facility day-ahead prices and coal prices are the nearby Rotterdam Coal Futures prices. Wholesale electricity prices for the euro area were calculated as a weighted average (applying net electricity generation as weights) of prices observed in the five biggest markets. The vertical line marks the start of the Russian invasion of Ukraine. The latest observations are for 7 June 2022.

## ඉරානය යළි නැගිටින උත්සාහයක



ඉරාන ජනාධිපති ඊබ්‍රහම් රයිසි (Ebrahim Raisi) ජාත්‍යන්තර සබඳතා තර කර ගැනීම වෙනුවෙන් මේ දිනවල වෙහෙසෙමින් සිටී. ඒ අතර අප්‍රිකානු රටවල් තුනක කළ සංචාරය විශේෂ කතාබහකට හේතු වී ඇත. කෙන්යාව, උගන්ඩාව සහ සිම්බාබ්වේ රාජ්‍යයන්හී කළ මෙම සංචාරය වසර දහයකට වැඩි කාලයකට පසු ඉරාන ජනාධිපතිවරයෙකුගේ පළමු අප්‍රිකානු සංචාරය වේ. ඉරානය එක්සත් ජනපද දැඩි ආර්ථික සම්බාධකවලට මුහුණ දෙමින් පීඩාවට පත්ව සිටීම මත ඉරානයේ ආර්ථික සබඳතා පුළුල් කිරීම මෙම සංචාරයෙ අරමුණ වී තිබිණි.

මෙම සංචාරයේදී ජනාධිපති රයිසි සහ කෙන්යාවේ ජනාධිපති රූටෝ සමඟ පර්යේෂණ සහ තාක්ෂණය යොදා ගනිමින් කෙන්යාවේ නිෂ්පාදන, සෞඛ්‍ය සහ මුහුදු ආර්ථික (Blue Economy) ක්ෂේත්‍ර වැඩිදියුණු කිරීමේ ක්‍රම පිළිබඳව සාකච්ඡා කළ අතර කෙන්යාව ඉරානය සමඟ වෙළඳාම වැඩි කිරීමට උනන්දු වෙයි. කෙන්යානු තේ, මස් සහ අනෙකුත් ගොවිපල නිෂ්පාදන අපනයනය වැඩි කිරීමට තම රජය ඉරානය සමඟ කටයුතු කරන බව ජනාධිපති රූටෝ සඳහන් කර ඇත. මෙම වෙළඳාම ඉරානය හරහා මධ්‍යම ආසියානු වෙළෙඳපොළ වෙත ප්‍රවේශවීමට කෙන්යාවට ද උපකාර වනු ඇත.

කෙන්යා සංචාරයෙන් පසුව ජනාධිපති රයිසි උගන්ඩාවේ සහ සිම්බාබ්වේ සංචාරයන්හිදී වෙළඳ සහ ද්විපාර්ශ්වික සබඳතා තර කර ගැනීම සම්බන්ධයෙන් සාකච්ඡා කර තිබිණි. ඉරාන විදේශ අමාත්‍යාංශය නිවේදනය කළේ අප්‍රිකානු රටවල් සමඟ වෙළඳාම මේ වසරේදී ඩොලර් බිලියන 2 ඉක්මවනු ඇතැයි අපේක්ෂා කරන බවයි. කෙන්යාවේ විදේශ අමාත්‍යාංශයට අනුව, නැගෙනහිර අප්‍රිකාවේ ප්‍රමුඛ ආර්ථිකයක් වන කෙන්යාවේ සංචාරය, දෙරටටම ඔවුන්ගේ පුරවැසියන්ගේ ප්‍රයෝජනය සඳහා ද්විපාර්ශ්වික සබඳතා නැවත මැන බැලීමකට සහ ඉහළ නැංවීමට අවස්ථාවක් සැලසෙනු ඇත.

ඉරාන නායකයෙකු අවසන් වරට අප්‍රිකාවට ගොස් ඇත්තේ 2013 වසරේදී මහමුද් අහමදිනෙජාඩ් එම සංචාරය සිදු කළ අවස්ථාවේදීය. ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් යටතේ එක්සත් ජනපදය න්‍යෂ්ටික ගිවිසුමින් ඉවත් වී 2018 සිට සම්බාධක නැවත ස්ථාපිත කිරීමෙන් පසුව ඉරානය සංවර්ධනය වෙමින් පවතින රටවලට සමඟ ද්වි පාර්ෂවික සබඳතා සහ වෙළඳ ගිවිසුම් සඳහා යොමුවෙමින් පවති.

පසුගිය ජූනි මස මුලදී, ජනාධිපති රයිසි ලතින් ඇමරිකානු රටවල් තුනක ද සංචාරය කළේ එක්සත් ජනපද සම්බාධකවලට මුහුණ දෙන රටවල් සමඟ මිත්‍ර සබඳතා ශක්තිමත් කරගැනීම සඳහා ය.

නිරෝෂන් පෙරේරා

# කංසා ගැන මෙච්චර උනන්දු ඇයි?

## සංචාරක රාජ්‍ය අමාත්‍ය ඩයනා ගමගේ




ඖෂධීය කංසා වගාවට පහුගිය අයවැයෙන් අපි අනුමැතිය ලබා ගත්තා. දැන් අපි කංසා වගා කිරීම සඳහා මෙන්ම ඒවා අපනයනයට සහ නිදහස් කර ගැනීම සඳහා බලාපොරොත්තුවෙන් ඉන්නවා. ආයුර්වේද අමාත්‍යාංශයෙන් වාර්තාවත් ලැබෙනකන් අපි බලාගෙන ඉන්නවා. ජනාධිපතිතුමත් වාර්තාවක් ඉල්ලා තියෙනවා. ඒ වාර්තාව ආවට පස්සේ ආයුර්වේද අමාත්‍යාංශය හරහා පනතක් ගෙනත් පාර්ලිමේන්තුවෙන් අනුමැතිය ලබාගෙන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නියමු ව්‍යාපෘතිය ආරම්භ කරනවා. ඉන් පස්සේ කලාප ලෙස වගා කිරීමට නියමිතව තිබෙනවා.

අපි ගණන් හදලා තියෙන විදිහට නියමු ව්‍යාපෘතිය මඟින් අවුරුද්දකට රුපියල් බිලියන 06ක් ප්‍රේෂණය කර ගැනීමට හැකියාව ලැබෙනවා. කංසා ගැන කතා කිරීමේදී එය මත් ද්‍රව්‍යයක් ලෙස භාවිතා කිරීමක් ගැන මා සඳහන් කරන්නේ නැහැ. කංසා කියන්නේ ඖෂධයක්. එයින් ඖෂධ විසිදෙකක් පමණ නිෂ්පාදනය කළ හැකි බව මේ වන විට සොයාගෙන තිබෙනවා. එවැන්නක් නියම ප්‍රමිතියෙන් යුතුව නිෂ්පාදනය කර අපනයන කිරීමෙන් ලංකාවට විශාල ආර්ථික ලාභයක් අත්පත් කරගන්න හැකියාව තිබෙනවා. ලෝකයේ මේ වන විට කංසා වගාවට මුල් තැනක් ලබා දෙමින් තිබෙනවා.

කංසාවලින් ඖෂධ නිෂ්පාදනයටත් විශාල ආයෝජන අවස්ථා තිබෙනවා. රටවල් විශාල ප්‍රමාණයකින් අපිට කතා කළා. කංසා අක්කර දහයක වගාවකින් රුපියල් මිලියන 200ක් ආදායමක් ලැබිය හැකි බවට තක්සේරු කළ ව්‍යාපෘති වාර්තා තිබෙනවා. ඒ සඳහා ඇස්තමේන්තු කරලා අවසන්.

නමුත් අපේ රටේ හැමදේම සලකන්නේ වැරදි විදිහටයි. මුහුණු පොත භාවිතා කරන්නේ කාටහරි අපහාස කරන්න. කංසා ගැන කතා කළොත් මත්ද්‍රව්‍ය ගැන පමණයි අදහස තිබෙන්නේ. නමුත් කංසා වගාව කියන්නේ ඩොලර් බිලියන ගණන් ආදායම් ලැබිය හැකි කර්මාන්තයක්.

ඉතිං මේක විශාල ව්‍යාපෘතියක්. මේක ගොඩක් අයට තේරුම් ගන්න බැහැ. මේ රටේ මිනිස්සු හිතාගෙන ඉන්නවා, ගංජා ගහලා පාරවල් ගානේ වැටිල, මහා නරක දෙයක් කියලනේ. ඇත්තටම මේ ගංජා කියන පැළය, කප්රුකකට එහා. අපේ මිනිස්සු තවමත් ඒක තේරුම් ගෙන නැහැ. මේක ලංකාවට ලැබිල තියෙන නිධානයක්. ඉතිං අපි ඒක පාවිච්චි කරන්න ඕන, වැරදි පැත්තට යන්නේ නැතිව. ඒ නිසයි මේක නියාමනයක් යටතට ගේන්න උත්සහ කරන්නේ.




# 13 ගැන ජනප්‍රිය තීන්දුවක් වෙනුවට ජනාධිපතිවරයා අවධානමක් ගත්තේ ඇයි?

## උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය සුරේන් රාඝවන්

ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා මධ්‍යම ආණ්ඩුවේ බලය බෙදා හැරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව 13 වැනි ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කිරීමට දරන උත්සාහයේදී "විශාල අවදානමක්" අරගෙන තිබෙනවා.

සිංහල ජනවාර්ගික බහුතරයක් සිටින ශ්‍රී ලංකාවේ දකුණේ බොහෝ නායකයින් ඉඩම් සහ පොලිස් බලතල ලබාදීම ඇතුළුව 13 සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීමට ඉඩ දීම සම්බන්ධයෙන් කනස්සල්ලක් පළ කළා.

ජනාධිපතිතුමා මෙතැනදි ලොකු අවදානමක් අරගෙන තියෙනවා. ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් ඔහු ඒ අවදානම ගෙන තිබෙන්නේ, විශේෂයෙන්ම අරගලයෙන් පසුව මේ රටේ ජනතාව බුද්ධිමත් යැයි ඔහු සිතන නිසා, අරගලයට සම්බන්ධ වුණු ජනතාවගේ අරමුණ වූයේ පාලනයේ ප්‍රතිසංස්කරණ ඇති කිරීමයි. ප්‍රජාතන්ත්‍රවාදය නිසා ඔහු ඒ අවදානම ගෙන ඇති බව මම විශ්වාස කරනවා.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13වන සංශෝධනය පිළිබඳ නැවත වරක් ජාතික වශයෙන් කතිකාවතක් ආරම්භ වී තිබෙනවා. හිටපු ජනාධිපතිවරුන් හත් දෙනාම අත නොගැසූ කාර්යයකට වත්මන් ජනාධිපතිතුමා හදිසියේම යොමු වුණේ ඇයි කියා ඇතැමුන් ප්‍රශ්න කරනවා. ඉතිහාසයේ සිටි සියලුම ජනාධිපතිවරුන් මේ ප්‍රශ්නය පිළිබඳ සාකච්ඡා කළා. දැන් අප පිවිස සිටින්නේ පශ්චාත් අරගල සමයකටයි.

මම අරගලයේ සටන්කරුවෙක් නෙමෙයි. නමුත් අරගලයෙන් පැන නැගුණු ස්වරය ඉතා පැහැදිලියි. තවදුරටත් පුරවැසියා හා රාජ්‍යය අතර සම්මුතිය අලුත් නොකර මේ රට පාලනය කළ නොහැකියි. ඒ බව මේ රටේ ජනතාව මෙන්ම මේ රට භාර ගන්න සිටින තරුණ ප්‍රජාව විසින් ඉතා පැහැදිලිව ප්‍රකාශ කර තිබෙනවා. රාජ්‍යය අලුත් කිරීමට නම්, එහි සියලුම පුරවැසි අභිලාෂ, දේශපාලන අභිලාෂ සහ සමාජ අවශ්‍යතා ඉටු කිරීම රාජ්‍යයක වගකීම වෙනවා.

ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා මෙම අවස්ථාවේදී සිදු කරන්නේ ජනප්‍රිය වැඩක් නොවෙයි. මගේ මේ කෙටි දේශපාලන කාලය තුළ ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා විශාල අවදානමක් අරගෙන මෙවැනි කතිකාවතකට මුලපිරීම සම්බන්ධයෙන් මම පුදුම වෙනවා. මා දකින විදිහට ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව තිබෙන ගැඹුරු විශ්වාසයක් ජනාධිපතිතුමා තුළ තිබෙනවා. ජනප්‍රිය නොවුණත්, හරි දේ කළ යුතුයි. මේ ප්‍රශ්නය ඊළඟ පරම්පරාවට භාර නොදී අපි විසඳාගත යුතුයි කියන බලාපොරොත්තුව ඇතුවයි එතුමා මේ කර්තව්‍යය ආරම්භ කළේ.

පක්ෂ නායකයන් සහ පාර්ලිමේන්තුවේ පක්ෂ විපක්ෂ මැති ඇමැතිවරුන් සමඟ පැවති සාකච්ඡාවකදී ජනාධිපතිවරයා විමසා සිටියා ඔබට 13වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අවශ්‍යද කියා. එය දශක කිහිපයක් තිස්සේ ව්‍යවස්ථාවේ කොටසක් බවට පත්ව තිබෙන බවත් එහිදී පෙන්වා දුන්නා. උතුරු පළාත් සභාවට පමණක් වසරකට රුපියල් බිලියන 300ක පමණ ප්‍රතිපාදන වෙන් කරනවා. එපමණ මුදලක් වියදම් කරමින් පළාත් සභාව නඩත්තු කිරීම අර්ථවත්ව සිදුවෙනවාද කියන ප්‍රශ්නය අප ඉදිරියේ තිබෙනවා.

ඒ වගේම දේශපාලනිකව එය පිළිගන්නේ නැතිනම් පාර්ලිමේන්තුව මැදිහත්ව එය අහෝසි කළ යුතු බවත් ජනාධිපතිතුමා පැහැදිලිවම ප්‍රකාශ කළා. දෙමළ දේශපාලන ප්‍රභූ පැළැන්තිය අතර ද අසමගියක් තිබෙනවා. ඔවුන් විවිධ මත දරණවා. ඇතැමුන් ෆෙඩරල්වාදයෙන් තොරව කිසිදු විසඳුමක් පිළිනොගෙන සාකච්ඡාවෙන් බැහැරව සිටිනවා. ඇතැමුන් විසඳුමක් ඉල්ලා සිටි විට ඒ වෙනුවෙන් කටයුතු නොකර සිටිනවා. ඉතින් ඔවුන්ගේ සද්භාවය ඒ ජාතියට ගැටලුවක්ව තිබෙනවා.

එසේ නම් මේ සම්බන්ධව සංවාදිත ප්‍රජාතන්ත්‍රවාදයකට යොමුවිය යුතුයි. මේ වන විටත් යෝජනා කර ඇති ආකාරයට 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය බලාත්මක කළ යුතුයි. එය තවදුරටත් කල්දැමිය යුතු නැහැ. මහින්ද රාජපක්ෂ මහතා සමඟ සාකච්ඡා කළ අන්දමට 13+ අවශ්‍ය බව යෝජනා කරන පක්ෂ ද සිටිනවා. පළාත් සභා ඡන්දය කල්දමා මේ මොහොත වන විට වසර හතකට ආසන්න කාලයක් ගතව තිබෙනවා. එසේ නම් ඒ මැතිවරණය පැවැත්විය යුත්තේ මේ ගැටලුව නිරාකරණය කරගෙනයි.

13 වන ව්‍යවස්ථා සංශෝධනයේ පවතින සියලු බලතල ලබා දෙනවාද කියන ප්‍රශ්නය මතුකර තිබෙනවා. පොලිස් බලතල ලබාදිය යුතුද යන්න ගැන සංවාදයක් තිබෙනවා. 13වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ පොලිස් බලතල පිළිබදව සඳහන්ව තිබුණත් එකිනෙකා අතර ඇති සැක සංකා හේතුවෙන් එය ක්‍රියාත්මක කර නැහැ. ඒ නිසා රාජ්‍යය සහ පුරවැසියා අතර තිබෙන අලුත් සම්මුතියේ කතිකාවතක් අද දෙමළ ජනතාවට ද අවශ්‍යව තිබෙනවා.

# නියඟය සමඟ ජල අර්බුදයට මුහුණ දෙන්නේ කොහොමද?

## ක්‍රීඩා හා යෞවන කටයුතු සහ වාරිමාර්ග රාජ්‍ය අමාත්‍ය රොෂාන් රණසිංහ




වියළි කාලගුණික තත්ත්වය හේතුවෙන් වලව ජලාශයෙන් ජලය ලබාදීමේ ගැටලුවක් මේ වන විට උද්ගත වෙලා තිබෙනවා. වලව ජලාශය හරහා ජලය ලබාගෙන කුඹුරු හෙක්ටයාර් 25,000ක් පමණ වගා කටයුතු සිදු කෙරෙනවා. ඒ වගේම අතුරු බෝග හෙක්ටයාර් 8000ක ප්‍රමාණයකුත් වගා කරනවා. එවැනි තත්ත්වයක් තුළ කුඹුරු සඳහා ජලය ලබාදීමේ ගැටලුවක් දැන් ඇතිව තිබෙනවා.

උඩවලව ජලාශයෙන් ලබා දෙන්න පුළුවන් ජල ප්‍රමණය සියයට 06ක්. එතැනින් පද්ධතියේ ඇල මාර්ගවලට ජලය මුදාහැරියත්, ගොවිබිම්කරා යන වේගය අඩාළ වෙලා තියෙනවා. පීඩන තත්වය අඩු නිසා.

උද්ගතව ඇති තත්ත්වය හමුවේ ගොවිතැන් සඳහා ජලය ලබා දෙනවාද?, අඛණ්ඩ විදුලි සැපයුමක් ලබාදෙනවාද? යන ගැටලුවත් මේ අවස්ථාවේ උද්ගත වී තිබෙනවා. නමුත් වගා ආරක්ෂා කර ගැනීම සම්බන්ධයෙන් අමාත්‍යාංශයක් වශයෙන් අප උත්සාහ දරමින් සිටිනවා. මෙහිදී රටේ ආහාර සුරක්ෂිතතාව සම්බන්ධයෙන් ද අවධානය යොමු කළ යුතුව තිබෙනවා.

පවතින වියළි කාලගුණික තත්ත්වය සම්බන්ධයෙන් පසුගියදා පැවති කැබිනට් මණ්ඩල හමුවේදී ද දීර්ඝ වශයෙන් සාකච්ඡාවට බඳුන් වුණා. එහිදී විදුලි බලය විසන්ධි නොකරන වැඩපිළිවෙළකට යාමේ අවශ්‍යතාව අවධාරණය කෙරුණා. කෙසේ නමුත් වියළි කාලගුණයත් සමඟ විදුලිය ලබා දෙන විදුලි ජනක යන්ත්‍ර (ජෙනරේටර්) සහිත නෞකා මඟින් විදුලිය ලබා ගැනීමේ කටයුත්ත කඩිනම් කළහොත්, විදුලි අර්බුදයත් විසඳා ගන්නා අතරේ ගොවීන්ට අවශ්‍ය ජලය ලබාදීමටත් හැකියාව තිබෙනවා. මේ සම්බන්ධයෙන් විදුලිබල මණ්ඩලයත් විශේෂ අවධානයක් යොමුකර තිබෙනවා.

සටහන
අසන්ත බණ්ඩාර



# මචං නදීක

වෙනස් තාලයේ රිද්ම මැවීම් සිදුවන්නේ එවන් වෙනස් මිනිසුන්ගෙන් යන වග අප අසා ඇති කලා කියවීමකි. කලාව ගෝචර වන බොහෝ විෂය මූලික තත්වයන් තුළදී බොහෝ ආඛ්‍යානයන් යම් යම් පුද්ගලික කියවීම් මත පොලා පැනීම අනිවාර්යයකි. ලංකාවේ රොක් සංගීතය නුහුරු නුපුරුදු දෙයක් යැයි කියන්නේ බණ පිරිත් අසා ඇති ඉතා සංයමශීලී පිරිසක් මත වුවත්, ආර්ථිකමය ඝට්ටනයන්හිදී විපර්යාස ගත බොහෝ කියවීම් සංගීතමය පාර්ශ්වීය කුළු ගැන්වීම අනිවාර්යයකි.

නදීක ජයවර්ධනගේ නිර්මාණවල අග්‍රඵලය වෙන්නේ පසුගිය වසරේ එළිදැක්වූ "සිහිනයක්" නම් Music Album එකය. එතැන් පටන් ඔහු ගැන කියවීම වෙනස් ආකාරයකවීම ලංකාවේ සංගීත ක්ෂේත්‍රයේ යම් පැතිකඩක් නිර්මාණය කිරීමට සමත්විය.

නදීක අද චැතම් ස්ට්‍රීට් ටී.වී. සමඟ සිදුවන හෙට හදන කයිය "මචං" හිදී ශානුක කරුණාරත්න සමඟ දොඩමළුවූයේද නව කලා මාදිලියක කියවීමක් සඳහාය.

ලෝකය නොදැක මියුසික්වලින් පමණක් ලෝකය දැකීම ප්‍රායෝගික ක්‍රියාන්විතයක් නොවේ. මේ නිසාම නදීක ජයවර්ධන මෙම උඩුගම් බලා පිහිනීම සිදු කළ යුතුමය.

*චැතම් ස්ට්‍රීට් යූ ටියුබ් නාලිකාව වෙනුවෙන් කළ "මචං" වැඩසටහනේ පසුගිය කොටස් නැරඹීමට මෙම QR කේතය Touch හෝ Scan කරන්න*







පිටකෝට්ටේ, මිෂන් පාර, අංක 19/5/ඒ දරණ ස්ථානයේ පදිංචි කේ.පී.අයි. ප්‍රියංගනී වන මා විසින් උඩහමුල්ල, විජේරාම මාවගේ පිහිටි TDL මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී